# ඔක් නිවසේ අභිරහස



මනුලි තිනෙත්මා ජයරත්න

# ඔක් නිවසේ අභිරහස

කතා - මනුලි තිනෙත්මා ජයරත්න

මහාමායා බාලිකා විදුහල
10 - A

2026.05.10

ISBN 624211091-1
9 786242 110912

# පිදුම

කුතුහලය සපිරි විස්මය කැටි කර
අභිරහස් කතාවල විසඳුම් පියවර
අපූරුවට ගෙත්තම් කර පිටු මත
පොතට පතට රුචි වැඩු ඒ අරුමය

සුවහසක් පාඨක හිත් ප්‍රබෝධමත් කර වූ
“ඉනිඩ් බිලයිටන්” නම් වූ
ඒ ශ්‍රේෂ්ඨ කතුවර නාමයට
ගෞරවාදරයෙන් .......

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙසට දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන් වූ ගුරු භවතුන් ඇතුලු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාළිගාව
2026.05.10

# පටුන


1. සොරකමක්

2. සෑම්

3. රහස් පරීක්ෂකයෝ වැඩ අරඹති

4. සාක්ෂි පිටුපස

5. සොරා කවුද?

6. අභිරහසේ අවසානය

# 1. සොරකමක්

ගම්බද පෙදෙසක අලංකාර කඳු මුදුනක පිහිටා තිබුණ ඕක් නිවස ගම් වැසියන් සියලු දෙනාගේ අවධානය දිනාගත් නිවසක් විය. නිවසට යාබදව පිහිටා තිබුණ විශාල ඕක් ගස, ගෙවත්තේ නිතර දෙවේලේ සැරිසැරූ පෝනියන් හා ඉතා පැරණි ගාම්භීර සුදු පැහැති උස ගොඩනැගිල්ල  නිසා මේ ඕක් නිවස ගමේ සියලුම නිවෙස් අතරින් කැපී පෙනුණි. එමෙන්ම මේ නිවසේ ජීවත් වූ නිවැසියන් ද ගමේ සියලුම දෙනා අතරින් කැපී පෙනුණේ ඔවුන්ගේ වංශවත්භාවය නිසා පමණක් නොව ඔවුන්ගේ කාරුණිකභාවයත්, සුහදශීලීබවත් නිසා ය.

එදා සෙනසුරාදා දිනයක් බැවින් හරි නම් ඕක් නිවසේ ප්‍රධාන ගෘහ පාලිකාව වූ ඇඩම්ස් මහත්මියට නිවාඩු ලැබිය යුතු දිනයකි. වීත් ඒ සෙනසුරාදා ඕක් නිවසේ ඩෙයාර් යුවල ඔවුන්ගේ දොළොස් හැවිරිදි දියණිය වූ ඇලිස් සමඟ නගරයට ගොස් තිබුණේ සර්කස් සන්දර්ශනයක් නැරඹීමට යි. ඒ නිසා ඇඩම්ස් මහත්මිය සෙනසුරාදා දිනයත් ඔවුන් එනතුරු ඕක් නිවසේම ගත කිරීම කැමැත්තෙන්ම භාර ගෙන තිබුණා ය. ඒ කවුරුවත්ම නැති නිසංසල ඕක් නිවසට වී උදෑසන වරුව තේ කෝප්පයක් බී  නිවිහැනහිල්ලේ ගත කිරීමේ අරමුණෙනි.

ඒ කිව්වාට ඇඩම්ස් මහත්මියට එදා උදේ වරුව පුරාවටම වැඩ රාජකාරි යෙදුණි. අතපසු වී තිබුණු ගෙදරදොර අස්පස් කිරීමේ කටයුතු සිදුකිරීමට ඇයට ඉස්පාසුවක් ලැබුනේ සෙනසුරාදා උදේ වරුවේ ය. සෙනසුරාදා උදෙන්ම ගෙදර යන්න බලාගෙන සිටි ඕක් නිවසේ සේවකයා වන සෑම් ද  ඇය වදෙන් පොරෙන් උදේ වරුව නිවසේ නතර කර ගත්තේ ඔහුට කියා ගෙවත්ත අස්පස් කර ගැනීමට යි. කට කොනෙන් ඇයට බනිමින් වුවද ඉක්මනින්ම වැඩකටයුතු අවසන් කළ සෑම් උදෑසන නමයත් පසුවී ඕක් නිවසින් පිටත් වූවේ ය.

ඇඩම්ස් මහත්මිය ඕක් නිවසේ පහළ තට්ටුවේ සියලුම දොර ජනෙල් වසා දමා ඉහළ මහලට වී තේ කෝප්පයක් සාදා ගත්තේ ඉන් අනතුරුවයි. තේ කෝප්පයත් සමඟ සුවපහසු ඇඳි පුටුවේ දිගා වූ ඇය දෑස් පියාගෙන තේ කෝප්පය තොල ගාන්නට පටන් ගත්තා ය. ටිකෙන් ටික පහළට බර වුණු ඇයගේ ඇස් පිහාටු පියවීමට ගතවුනේ සුළු මොහොතක් පමණි. විකාර සිහින ගොන්නක් මැදින් සිහින ලෝකය පුරාවටම ඇඩම්ස් මහත්මිය සැරිසැරීමට පටන් ගත්තා ය. නමුත් ඒ ඇයට එක්වරම විශාල ශබ්දයක් ඇසෙන තෙක් පමණි. ඒ ශබ්දය ඇසෙනවාත් සමගම නින්දෙන් මිදුණු ඇඩම්ස් මහත්මිය ඉද්ද ගැසුවාක් මෙන් ඇඳි පුටුවේ කෙලින් වූවා ය. ඇයට මුලින්ම හිතුනේ ඒ ශබ්දයත් ඇය දුටු සිහිනයේ ම කොටසක් වන්නට ඇතැයි කියා ය. ඒ වුනාට නැවතත් බඩු එහා මෙහා වන පුංචි ශබ්ද නිසා ඇඩම්ස් මහත්මිය මහත් සේ කලබලයට පත් වූවා ය.

තේ කෝප්පය පසෙකින් තැබූ ඇඩම්ස් මහත්මිය තරප්පු පෙළ හරහා පහල තට්ටුවට දුව ගියේ වෙවුලන පාද වලිනි. පහල තට්ටුවේ විසිත්ත කාමරයට පිවිසුණු ඇයට එම කාමරයේ කිසිඳු වෙනසක් දක්නට නොලැබුණි. ඔක්කොම පැත්තක තබා ඇය මුලින්ම බැලූවේ විසිත්ත කාමරයේ පසෙකින් පිහිටා තිබෙන නිවසේ ප්‍රධාන දොරටුව දෙසයි. මීට මිනිත්තු තිහකට පමණ පෙර ඇය විසින් වසා දැමූ අයුරින්ම එම දොර අගුළු ලා තිබුණි. ඊළඟට ඇයට මුලින්ම මතක් වුණේ විසිත්ත කාමරයට වම් පසින් තිබෙන ඩෙයාර් පවුලට අයත් වටිනා සහ පැරණි භාණ්ඩ ගබඩා කර ඇති කාමරය පිළිබඳවයි. එම කාමරයට ඉක්මනින්ම දිව ගිය ඇයට දැනුණේ ඇගේ දෙපා පණ නැති වී වැටෙන්නට යනවාක් මෙනි .

ඒ කාමරයේ සියලුම බඩුභාණ්ඩ එහෙ මෙහෙ විසිරුවා අවුල් ජාලයක් කරවා තිබුණි. මේ ගෙදරට පැන බඩු එහෙ මෙහෙ අවුල් කර දැමූ සොරා කවුරු වුණත් ඔහු මේ ගෙදර ඇතුළට ප්‍රාදුර්භූත වුණේ කුමන ආකාරයකටදැයි ඇයට තේරුම් ගත නොහැකි විය. ඒ සමගම ඇඩම්ස් මහත්මියට කල්පනා වුණේ මේ වෙලාවෙත් මේ හොරා මේ ගෙදර ඇතුළෙම සිටිය යුතු බවයි. ඒ හැඟීමෙන් මහත් සේ භීතියට පත්වූ ඇය ඉක්මනින්ම තමා අත වූ යතුරු කැරැල්ලෙන් ප්‍රධාන දොරටුව විවෘත කරගෙන ගෙවත්තට පැන්නා ය. ඒ ගමන්ම මිනිත්තුවක්වත් ප්‍රමාද නොවූ ඇය ඉක්මනින්ම දොර නැවත අගුලු දැමුවේ ඇතුලේ ඉන්න කෙනා කවුරු වුණත් එළියට පැමිණීමට නොහැකි වීමටයි. ඇඩම්ස් මහත්මිය අවට ගෙවල්වලට මේ පණිවිඩය කියා ඔවුන්ව ඕක් නිවසට රැගෙන එන විට තවත් වේලාවක් ගත වී තිබුණි. ඕක් නිවස ආසන්නයේ වෙනත් අසල්වැසි නිවෙස් නොතිබුණු බැවින් ඇයට ළඟම සිටින අසල්වැසියා සෙවීමටත් පාර දිගේ ගමන් කිරීමට සිදුවිය. කෙසේ හෝ අසල්වැසියන් ද පිරිවරාගෙන ඇය නැවතත් ඕක් නිවසට පැමිණෙන විට බෙහෙවින් කලබල වී සිටියා ය.

ගෙදර නෝනා මහත්තයලා නොමැති අවස්ථාවක මේ වගේ හොරකමක් සිද්ධවීම ගැන ඇඩම්ස් මහත්මිය මහත් සේ කලබලයට පත්වී සිටියා ය. ඒ වෙලාවේ ගෙදර හිටියේ තමන් පමණක් වන බැවින් මේ සිද්ධියේ වගකීම ගන්නට වෙන්නේ තමන්ට බව ඇයට සිහි විය. මේ සිද්ධ වුණ සිදුවීම නිසා හදිසියේ හෝ තමන්ගේ මේ රස්සාව නැති වුණොත් කුමක් කරන්නදැයි ඇඩම්ස් මහත්මියට සිතාගත නොහැකි විය. ඊටත් වඩා ඇයට ප්‍රහේලිකාවක් වුණේ ගෙදර සියලුම දොර ජනෙල් වසා තිබියදී ගෙයක් ඇතුලට පැමිණෙන්නට පුළුවන් වෙන්න මේ හොරා මායාකාරයෙක්වත් ද කියා ය. අසල්වැසියන්ට ඇයගේ මේ කලබල ගතිය නැති කරන්නට බොහෝ වේලාවක් ගත විය. ඒ අතර අසල්වැසියෙක් විසින් ගමේ පොලිස් ස්ථානයට දුරකතන ඇමතුමක් දී පොලිස් නිලධාරීන් නිවසට ගෙන්වාගෙන තිබුණි. ඩෙයාර් යුවළ සහ ඔවුන්ගේ දියණිය ද සිදුවීම ගැන දැනගෙන සර්කස් සන්දර්ශනය පසෙක තබා ඉක්මනින් ඕක් නිවසට පැමිණියේ බොහෝ කලබලයෙනි.

පොලිස් නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීම් හමුවේ ඇඩම්ස් මහත්මිය අන්දමන්ද වී සිටියා ය. ඇයට හැමෝටම කියන්න තිබුණේ උදෑසන එකොළහට පමණ තමන් උඩු මහලට වී තේ බොමින් සිටින විට පහළ තට්ටුවෙන් විශාල ශබ්දයක් ඇසී තමන් පහළට පැමිණි බව පමණි. එතැනින් එහාට පවසන්නට කිසිඳු දෙයක් ඇඩම්ස් මහත්මියට තිබුණේ නැත. පොලිස් නිලධාරීන් නිවස පරීක්ෂා කිරීමේ දී දැනගැනීමට හැකිවුණේ ඉතා වටිනා පිත්තල පහන් ඇතුළු පුරාවස්තු කිහිපයක්ම නැතිවී ඇති බවයි. මේ ප්‍රදේශයේ මේ වගේ හොරකම් නිතර දෙවේලේ සිදු නොවන නිසා මේ ආරංචිය මුලු ගමටම වැදගත් ආරංචියක් විය. කෙසේ හෝ එදින සවස් යාමය වන විට මුළු ගමේම කතාබහට ලක් වූ මාතෘකාව වූයේ ඕක් නිවසේ සොරකම පිළිබඳවයි.

# 2. සෑම්

ඕක් නිවස පෙනෙන මානයේ අසල්වාසයක ජීවත් වූ මිතුරන් සිව් දෙනෙකු වූ ඩෑන්, විල්, ජෙසී සහ සූසන් මේ සොරකම පිළිබඳව දැන ගත්තේ සෙනසුරාදා සවස් වරුවේ ය. සිදුවීම ආරංචි වී නැවතත් තම නිවසේ සිට ඕක් නිවසට පැමිණි නිවසේ සේවකයා වන සෑම් වෙතින් ඔවුන් සියළු තොරතුරු තත්කාලීනව දැනගෙන තිබුණි.

"මම ගෙදර හිටිය නම් කීයටවත් ඔය වගේ හොරකමක් වෙන්නේ නැහැ. ආයෙ කතා දෙකක් නෑ, ඇඩම්ස් නෝනා මම ගියාට පස්සේ ඇතුලට වෙලා තේ එකක් බිබී නිදි කිර කිර ඉන්න ඇති. ඔහොම වෙලාවක හොරු ගෙදරකට එන එක අහන්නත් දෙයක්යෑ. නැති වෙලා තියෙන්නෙ ගොඩක් වටිනා පිත්තල බඩු වගයක්ලු. ඔය බඩු භාණ්ඩ පරම්පරා ගාණක් තිස්සේ මේ පවුලේ පැවත එන දේවල්. අපේ මහත්තයලට වෙලා තියෙන්නේ ලොකු පාඩුවක්."

සෙනසුරාදා සවස ඩෑන්ගේ නිවසට පැමිණි සෑම් ඔවුන් සමඟ කියවන්නට ගත්තේ ය. සෑම් දහ අතේ කල්පනා කළේ මේ හොරකම කරන්නට ඇත්තේ කවුරුන් විසින්ද කියලයි. මේ ගමේ මෙහෙම හොරකමක් කරන්න පුළුවන් කෙනෙක් ගැන කොච්චර මතක් කළත් සෑම්ට මතකයට නගා ගැනීමට හැකිවුණේ නැත. ඇත්තටම මේ ගමේ ඉන්න බොහොම හොඳ මිනිස්සු මේ වගේ දෙයක් කරාවියැයි ඔහුට කොහොමටවත් විශ්වාස නොවී ය.

කොහොම වුනත් ඩෑන්, විල්, සූසන් සහ ජෙසීට මේ සොරකම ඉතා වැදගත් විය. ඕක් නිවසේ ඇලිස් ඔවුන්ගේ හොඳම මිතුරියක වීම ඊට හේතුවයි. මේ සිදුවීම නිසා පොඩි දේටත් කලබල වන ඇලිස් බොහෝ සෙයින් කම්පනයට පත් වී ඇතැයි ඔවුන්ට විශ්වාස විය. කොහොමටත් ඇලිස් සමඟ සෙල්ලම් කිරීමට නිතර දෙවේලේ ඕක් නිවසට යන එන, ඩෙයාර් පවුලේ ළඟම හිතවතුන් පිරිසක් වන නිසා ඔවුන්ට මේ සොරකම පිළිබඳව දැනගත්විට යම් කම්පනයක් ඇතිවී තිබුණි. ඒ ගැන දැනගත් වහාම සෑම් ද සමඟ ඕක් නිවසට යාමට ඔවුන් සිව්දෙනාට ඕනෑ වුණත් ඩෑන්ගේ මව පැවසුවේ මේ වෙලාවේ ඔවුන්ට කරදර කිරීමෙන් ඵලක් නොවන බවයි. මොහොතකින් සෑම් ද ඕක් නිවසට පිටත්ව ගිය විට මේ සිද්ධිය පිළිබඳව කතා කිරීමට මිතුරන් සිව් දෙනාට ඉඩපාඩු ලැබුණි.

"ඔයාලට හිතෙන විදිහට කවුරු වෙන්න ඇත්ද මේ වැඩේ කරන්න ඇත්තේ?"

විල් බැරෑරුම් මුහුණින් සියලුම දෙනාගෙන් ඇසුවේ ය. නමුත් අනෙක් තිදෙනාටත් ඒ පිළිබඳව කිසිදු අදහසක් නොතිබුණි . කොහොම වුනත් හෙට උදේම ඕක් නිවසට ගොස් ඇලිස් මුණගැසිය යුතු බව මිතුරන් සිව්දෙනාම සිතා ගත්හ.

පසුදින උදෑසනම මුළු ගම පුරාම පැතිර ගියේ පුදුම ආරංචියකි. එනම් ඕක් නිවසේ සිදුවූ සොරකමට සැකපිට එම නිවසේ සේවය කරන සෑම් අත්අඩංගුවට ගෙන ඇති බවට වූ පුවතයි. උදේ සවස ගම පුරාම ඇවිදිමින් සියලු දෙනාත් සමඟ හිත හොඳින් කටයුතු කරන සෑම් මෙවැනි දෙයක් කරාවියැයි ගමේ කිසිවෙකුටත් අදහා ගැනීමට නොහැකි විය. ඔහු වසර ගණනාවක් පුරාවට ඩෙයාර් පවුලට බොහෝ අවංක විශ්වාසවන්ත සේවකයෙකු ව සිටියේය. ඔහු අතින් කවදාවත් පුංචිවත් අත්වැරැද්දක් ඩෙයාර් පවුලට සිදුවී නොතිබුණි. එහෙම පුද්ගලයෙක් මේ වගේ හොරකමක් කරාවියැයි කිසිවෙකුටත් විශ්වාස කරන්නට නොහැකි විය. මේ පිළිබඳව දැනගත් වහාම ඩෑන්, විල්, ජෙසී සහ සූසන්ටත් ඇතිවුණේ එවැනි හැඟීමකි. කලින් දා සවස මේ සොරකම කළේ කවුරුන්දැයි ඔවුන් සමඟ කියවමින් සිටි සෑම් මෙවැනි දේකට අසුවීම පිළිබඳව ඔවුන්ට දැනුනේ මහත් කණගාටුවකි. තනිවම ජීවත් වන ඔහුට කොහොමටවත් ඒ වගේ හොරකමක් කිරීමේ අවශ්‍යතාවයක් නැති බව ඔවුන්ට හොඳටම විශ්වාස විය.

උදෑසනම ඇලිස් මුණගැසීමට ඕක් නිවසට ගිය ඔවුන් සිව්දෙනාත් සමග ඇලිස් පැවසුවේ ද එවැනිම කතාවකි. ඩෙයාර් පවුලේ අයට ද සෑම් මේ වගේ හොරකමක් කරන්නට ඇතැයි කිසිඳු සැකයක් තිබුණේ නැත. දැන් ඔවුන්ගේ ලොකුම කණගාටුව වී තිබුණේ මේ සොරකමටත් වඩා ඒ සොරකමට අසු වී සිරී සිටින්නේ ඔවුන්ගේ සේවකයෙකුටත් වඩා පවුලේ සාමාජිකයෙකු බඳු වූ සෑම් වීමයි. ඇලිස් පැවසූ ආකාරයට ලොකුම සැකකරු වී ඇත්තේ සෑම් ය. ඇඩම්ස් මහත්මියට අමතරව නිවසේ යතුරු ළඟ තබාගෙන සිටින්නේ සෑම් ය. ඔහු උදේ නවයට ඕක් මන්දිරයෙන් පිටත්ව ගියත් කොහේට ගියේද යන්න පිළිබඳව කිසිදු සාක්ෂියක් නොපැවතීම ලොකුම ප්‍රශ්නය වී තිබුණි. කොහොමටත් සෑම්ගේ ගෙදර වෙන කවුරුත් නැති නිසා ඔහු ගෙදර ආවේ ද නැද්ද යන්න පිළිබඳව සාක්ෂි ලබා දීමට කිසිවෙකුත් නැත. ඒ නිසා සෑම් සැකයට බඳුන් වුණේ නිරායාසයෙනි. පොලිසියේ අදහස වී තිබුණේ උදෑසන නමයට සෑම් ඕක් නිවසෙන් පිටව ගියද ඒ අවටම ගැවසෙමින් සිට උදෑසන එකොළහට පමණ මේ සොරකම සිදුකරන්නට ඇති බවයි. කොහොමටත් ඕක් නිවසේ ඇතුළත පිහිටීම පිළිබඳව ඔහු තරම් හොඳින් දන්නා වෙනත් කිසිවෙක් නොමැති නිසා සොරකම කරන්නට ලොකුම ඉඩකඩ ඇත්තේ ඔහු බව පොලිසියේ අදහස වී තිබුණි.

"සෑම්ට කීයටවත් මේ වගේ දෙයක් කරන්න බැහැ."

ඕක් නිවසේ ඉදිරි මිදුලේ තණ බිස්සේ වාඩි වී සිටින අතරේ හිස දෑත්වල හොවාගත් ඇලිස් පැවසුවේ කණගාටුවෙනි.

"මේ අහන්නකෝ......" දිගු කල්පනාවකට පසු විල් පැවසූ වදන්වලින් සියලු දෙනාගේ මුහුණු ඔහු වෙතට හැරුණි.

“අපි හැමෝම හොඳටම දන්නවනේ සෑම් ඒ වගේ දෙයක් කරන කෙනෙක් නෙමෙයි කියල. එහෙනම් මේ වැඩේ කරලා තියෙන කෙනා කවුද කියලා අපි හොයා ගන්න එක තමා කරන්න තියෙන හොඳම වැඩේ. අපි එකතු වෙලා හොයලා බලමු කවුද මේ හොරකම පිටුපස්සේ ඉන්නේ කියල” විල් පැවසුවේ ය.

ඒ ඇසූ සූසන්ගේ මුහුණ සිනහවකින් ඔපවත් විය.

“හරියට නිකං රහස් පරීක්ෂක කණ්ඩායමක් වගේද?” ඇය ඇසුවා ය.

“ඔව්, අපට පුළුවන් මේ ගැන හොඳ රහස් පරීක්ෂකයෝ විදිහට පරීක්ෂණයක් කරලා මේ අභිරහස විසඳන්න.” ජෙසී ද මේ අලුත් අදහසට අවනත වෙමින් පැවසුවා ය.

“හොඳයි, එහෙනම් මොකද කියන්නෙ හැමෝම කැමැතිද?”

ඩෑන්ද අදහස් දැක්වූවේ ය.

“සෑම් බේරා ගන්න ඕනෙම දේකට කැමති වෙනවා.” ඇලිස් ද එකතු වූයේ මහත් වූ සතුටිනි.

## 3. රහස් පරීක්ෂකයෝ වැඩ අරඹති

"හොඳයි. දැන් අපි කතා වුණා වගේ මේ අභිරහස විසඳන්න පටන් ගන්නේ කොතැනින් ද?" එදිනම සවස් වරුවේ නැවත සූසන්ගේ නිවසේ දී මිතුරු මිතුරියන් කතාවට එක්වූහ.

"හරි, මේ අභිරහස විසඳන්න නම් මුලින්ම කරන්න ඕනේ අපි සාක්ෂි එකතු කරගන්න එක. හැමදේටම කලින් වැදගත් වෙන්නේ මේ සිද්ධියට සම්බන්ධ අයගේ ප්‍රකාශ සටහන් කර ගන්න එක."

විල් පැවසුවේ දැනමුත්තකු ලෙසයි.

"හම්මේ.... විල් දන්න දේවල්" සූසන් පැවසුවේ සමච්චල්සහගතව යි.

"ඔව්, මගේ මාමා තමයි මේ මෙහෙ පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක. ඒ නිසා මම ටිකක් ටිකක් දන්නවා අභිරහසක් විසදන්න පටන් ගන්න විදිහ. ඒ වුනාට ගොඩක්ම වැදගත් වෙන්නේ අපි අභිරහස විසඳාගෙන යද්දී කටයුතු කරන විදිහ." විල් පැවසුවේ ය.

"එහෙනම් මුලින්ම කරන්න ඕන ඇඩම්ස් නෝනගෙන් සාක්ෂි ලබා ගන්න එක" ඩෑන් පැවසුවේ ය.

"ඇඩම්ස් නෝනා නම් ඉන්නේ දැන් සාක්ෂි දෙන්න පුළුවන් තත්වෙක නෙවෙයි. කිහිප වතාවක්ම එක එක අයට වුන සිද්ධිය කියලා එයා දැන් ඉන්නේ හොදටම කම්පනය වෙලා. ඒ නිසා එයාගෙන් ඇහුවා කියලා වැඩක් වෙන එකක් නම් නැහැ. කොහොමත් අපි දන්නවනෙ මොකද්ද එතැන සිද්ධ වුණේ කියලා. එතනින් එහා වෙන විස්තරයක් අපට ඇඩම්ස් නෝනගෙන් දැන ගන්න ලැබෙන්නෙ නැහැ කියල මට සහතිකයි."

ඇලිස්ගෙ වදන්වලට අපි සියලුම දෙනා එකඟ වුණේ ඕක් නිවසේ පවතින තත්වය හොඳින්ම දන්නේ ඇය නිසයි.

"හොඳයි. එහෙනම් අපට කරන්න තියෙන්නේ වුන සිද්දිය අපි දන්න විදිහට පෙළ ගස්වන එක. එහෙම වුණොත් ඉස්සරහට වැඩ කරගෙන යන්න අපට පහසු වෙයි"

ජෙසී පැවසුවේ සටහන් පොතක් අතට ගනිමිනි.

"හොඳයි අපි දැන් මේක දන්න විදිහට කිව්වොත් මේක තමයි මෙතන සිද්ද වෙලා තියෙන්නෙ. උදේ හතට ඩෙයාර් නෝනයි මහත්තයයි ඇලිස් එක්ක සර්කස් සන්දර්ශනය බලන්න යන්න පිටත් වුණා. ඒ වෙලාවේ ගෙදර හිටියේ සෑම්, ඇඩම්ස් නෝන විතරයි. උදේ අටට විතර සෑම් ගෙදර යන්න බලාගෙන හිටියත් ඇඩම්ස් නෝන, සෑම් නවත්තගෙන තියෙනවා ගෙදර අස්පස් කරන්න. කොහොම හරි උදේ නමයට විතර සෑම් ගෙදරින් පිටත්වෙලා තියෙනවා. ඉතුරු වැඩ ටිකත් ඉවර කරලා ඇඩම්ස් නෝනා උදේ දහය හමාරට  විතර පහල තට්ටුවේ දොර ජනෙල් සේරම වහලා උඩ තට්ටුවට ගිහින් තේ එකක් හදාගෙන බොන ගමන් තමයි ඉඳලා තියෙන්නේ.

උදේ එකොළහට විතර ඇඩම්ස් නෝනට සද්දයක් ඇහිලා පහලට ඇවිත් බලනකොට තමයි මේ  සිද්ධිය දැකලා තියෙන්නෙ. ඒ වෙලාවෙත් පහල තට්ටුවේ ඔක්කොම දොර ජනෙල් වහලා අගුළු දාල තමයි තිබිලා තියෙන්නේ. ඒ වුනාට පහල තට්ටුවේ ගබඩා කාමරය අවුස්සලා එතැන තිබුණ බඩු කිහිපයක් හොරකම් කරගෙන ගිහිල්ලා තියෙනවා. ගෙදර යතුරු තිබිලා තියෙන්නෙත් ඇඩම්ස් නෝන ගාවයි, සෑම් ගාවයි විතරයි. දැන් තියෙන ලොකුම ප්‍රශ්නෙ මේ හොරා කවුරු වුණත් කොහොමද ගේ ඇතුළට ආවේ කියන එක. අපි ඒක හොයා ගත්තොත් මේ ප්‍රශ්නයෙන් භාගයකටම උත්තර ලැබෙනවා."

සූසන් දීර්ඝ පැහැදිලි කිරීමක් සිදු කළා ය.

"හොඳ පැහැදිලි කිරීමක් සූසන්" ඩෑන් පැවසුවේ සිනහසෙමිනි.

"එහෙනම් අපි මුලින්ම කරන්න ඕනේ කොහොමද මේ හොරා ගේ ඇතුළට ආවේ කියල හොයාගන්න එක. මම හිතන්නේ ඒකට අපට ඕක් මන්දිරය පරීක්ෂා කරලා බලන්න වෙනවා. ඇඩම්ස් නෝනා කියන විදිහට පහල තට්ටුවේ සේරම දොර ජනෙල් වහලා තිබිලා තියෙන්නේ. පහළ තට්ටුවෙන් ඇරෙන්න උඩ තට්ටුවේ වෙන තැනකින් හරි කෙනෙකුට ගේ ඇතුළට ඇතුළු වෙන්න පුළුවන්ද කියලා අපි හොයලා බලන්න ඕන." ඩෑන් වැඩිදුරටත් පැවසුවේ ය.

"හොඳයි, අපට පුළුවන් දැන් අපේ ගෙදරට ගිහිල්ල බලන්න. මේ වෙලාවේ අම්මයි තාත්තයි ගෙදර නැතුව ඇති. අපට නිදහසේ  පරීක්ෂා කරලා බලන්න පුළුවන්."

ඇලිස් පැවසුවා ය.

ඇයගේ වචනවලට අවනත වූ සියළු දෙනාම ඕක් නිවසට පිටත්ව ගියහ. දැඩි උද්යෝගය නිසා ඔවුන්ට කුඩා කඳු ගැටය තරණය කර  ඕක්  නිවසට ලගා වීමට ගතවුනේ මිනිත්තු කිහිපයක් පමණි. නිවසට පැමිණි ඔවුන්ට දක්නට ලැබුණේ, නිවසේ සිටින්නේ ඉඳ හිට ඕක් නිවසේ අශ්වයින්ට සාත්තු කිරීමට පැමිණි මහලු ස්මිත් මහතා පමණක් බවයි. ඔහු නිවස පිටුපස ඉස්තාලයට වී පෝනියන්ට සාත්තු කරමින් සිටි නිසා ස්මිත් මහතාගෙන් ද මිතුරු පිරිසට කිසිදු බාධාවක් ඇති නොවුණි.

ඇලිස් සමඟ ඔවුන් මුලින්ම ඇතුළු වුණේ නිවසේ පහළ මාලයේ ප්‍රධාන දොරටුව හරහා විසිත්ත කාමරයටයි. විසිත්ත කාමරය සහ පහල මාලයේ පිටුපස දොරටුව වන මුළුතැන්ගේ දොරටුව අසල ද පරීක්ෂා කර බැලුවත් ඇතුලතින් දොර අගුලුලා ඇති විට කීයටවත් දොර ඇරගෙන ඇතුලට පැමිණෙන්නට නොහැකි බව මිතුරන්ට අවබෝධ විය. මුළු පහළ මහලම ඇලිස් සමඟ පරීක්ෂා කර බැලුවත් එසේ ඇතුළු විය හැකි වෙනත් ස්ථානයක් සොයා ගැනීමට නොහැකි විය. සොරකම සිදුවූ ගබඩා කාමරය තුළට ඇතුළු වීමට ඔවුන්ට තවමත් අවසර නැති වුනත් නිවස පිටුපසින් ගොස් එම කාමරයේ ජනේලයෙන් කර පොවා බැලූ  ඔවුන්ට ජනේලයෙන්වත් කිසි විටෙක ඇතුළුවීමට නොහැකි බව වැටහුණි. එමෙන්ම ඇලිස් පැවසුවේ සාමාන්‍යයෙන් එම කාමරයේ ජනෙල් දොරවල් නිතර දෙවේලේ අරින්නෙත් නැති බවයි.

“මට නම් තේරෙන්නේ නැහැ මේකේ ඇතුළට කොහොම නොදන්න කෙනෙක් ඇතුළු වෙන්නද කියලා. කොහොමත් ඕක් නිවස බලකොටුවක් වගේ එළියෙන් ආරක්ෂා වෙලානෙ තියෙන්නෙ.”

පරීක්ෂා කිරීමෙන් වෙහෙසට පත්වූ ජෙසී පැවසුවා ය.

“ඒ උනාට මොකක්ම හරි ක්‍රමයක් තිබිලා තියෙන්න ඕනෙමයි. එහෙම නැත්නම් මෙහෙම හොරකමක් සිද්ධ වෙන්න විදිහක් නැහැනේ.”

එසේ පැවසූ විල් ඇලිස් වෙතට හැරුණේ ය.

“ඇලිස්, ඔයාට මතකයක් තියෙනවද මේ ගෙදර හොදට අගුළු දාන්න බැරි මොකක් හරි දොරක්, ජනේලයක් වගේ දෙයක්?”

එහෙත් ඒ ප්‍රශ්නයට ඇලිස්ට එක්වරම පිළිතුරක් තිබුණේ නැත.

“කෝකටත් අපි උඩ තට්ටුව පරීක්ෂා කරලා බලමු. අපට සමහර විට හෝඩුවාවක් ලැබෙන්න පුළුවන්.” ඇලිස් පැවසුවා ය

ඇයගේ වචනයෙන් සැවොම නිවසේ උඩුමහල වෙතට ගියහ .

සොරකම සිදුවන අවස්ථාවේ උඩුමහලේ ජනෙල් දොරවල් අගුලු ලා නොතිබුණත් උඩුමහලෙන් නිවසට ඇතුළුවිය හැකි කිසිදු ක්‍රමයක් ඔවුන්ට සොයා ගැනීමට නොහැකි විය. කොහොමටත් ඇඩම්ස් මහත්මිය උඩුමහලේ සිටින විට ඇයට නෑසී ඇය සිටින තැනින්ම කිසිම අයෙකුට පහළ මහලට යාමට නොහැකි බව ඔවුන්ගේ හැඟීම විය.

ඇඩම්ස් මහත්මියට කොතරම් තදින් නින්ද ගියත් දොරක් විවෘත කරගෙන උඩුමහලට අයෙක් ඇතුළු වී තමන් පසුකර යනවාවත් නොදැනෙන තරමටම නින්ද යනු ඇතැයි ඇලිස් කිසිසේත්ම විශ්වාස කළේ නැත. උඩුමහලේ සියලුම ස්ථාන පරීක්ෂා කර බැලුවත් ඔවුන්ට කුඩා හෝ හෝඩුවාවක් හමු නොවීම සියලු දෙනාටම තරමක අධෛර්යයක් ගෙන දෙන්නක් විය. අන්තිමේ පරීක්ෂා කිරීම අත්හැර දැමූ මිතුරු මිතුරියන් තරප්පු පෙළ බැස පහළ තට්ටුවට යාමට සූදානම් වුණා පමණි, එක්වරම පිටුපස සිටි ඇලිස් කෑගැසුවේ යමක් මතක් වූ ලෙසයි .

“හරි. මට අමතක වුනානෙ.... උඩ තට්ටුවේ තරප්පු පෙල බහින තැනම වම් පැත්තෙ තියෙනවා පුංචි ගබඩා කාමරයක්. ඒ කාමරය ඇතුළෙ තියෙන්නේ කොසු ඉදල් වගේ දේවල්. ඒ කාමරය ඇතුලේ තියෙන ජනේලයේ අගුල කැඩිලා තියෙන්නෙ. ඒ නිසා ඒක ඇතුලෙන් අගුළු දාන්න විදිහක් නැහැ. ඒ වගේම ගබඩා කාමරේ දොරටත් අගුලක් නැහැ.”

ඇලිස්ගේ ප්‍රකාශයෙන් ඔවුන් සියලු දෙනා මවිතයට පත් වූහ. සියලුදෙනාම ඇලිස් සඳහන් කළ ගබඩා කාමරයට දිව්වේ විදුලි වේගයෙනි.

“මේ බලන්න, මේ කාමරයේ තියෙන ජනේලයත් බිත්තියක් පිරෙන්නම තියෙනවා. මේ ජනේලය ඇතුළෙන් මනුස්සයෙක්ට ඇතුළට එන එක නම් සුළු දෙයක්.

ඒ වගේම මේ කාමරය හරහා ආවොත් ඇඩම්ස් නෝනාව පහුකරගෙන පහළට යන්න ඕනේ වෙන්නෙත් නැහැ. ඒ වගේම මේ ජනේලය අගුළු දාලා නැත්නම්, දොරත් අගුළු දාලා නැත්නම් ඕනෙම කෙනෙක්ට පහසුවෙන් මේකට ඇතුළු වෙන්න පුළුවන්."

ගබඩා කාමරය තුළට පැමිණ ජනේලෙන් එලිය බලාගෙන සිටි සූසන් පැවසුවා ය.

"ඔව්, ඒ වුනාට මේ ජනේලය තියෙන්නේ ගෙදරින් ගොඩක් උඩ. ඉතින් ඔයාලා හිතන්නේ කොහොමද කෙනෙක් මේ ජනේලය ලඟට එළියෙන් ළං වෙන්නෙ?" ජෙසී විමසුවා ය.

"ඇයි අනේ පේන්නේ නැද්ද ...මේ ඕක් ගහේ අත්තක් මේ ළඟටම තියෙනවා. ඒ අත්ත ගාව ඉඳලා මේ ජනේලයට පනින එක එච්චර අමාරු වැඩක් නෙවෙයි. කිසිම කෙනෙකුට වත්තට එන්න ලොකු අමාරුවක් නැහැනේ. ඉතින් ඕක් ගහ දිගේ උඩට නැගලා ජනේලයෙන් ගේ ඇතුලට එන්න ඕනම කෙනෙක්ට පුළුවන්. මට හොඳටම විශ්වාසයි ඒක තමා මෙතන සිද්ධ වෙන්න ඇත්තෙ කියල."

විල් පැහැදිලි කළේ ය.

"අපි එහෙනම් දැන් හොයා ගත්තනේ කොහොමද හොරා ගේ ඇතුලට ඇතුල් වුනේ කියල. දැන් අපිට කරන්න තියෙන්නේ හොරා ආවා වගේම ඒ පාර දිගේ අපි ගිහින් බලන එක. එතකොට තමයි අපට සාක්ෂි හොයාගන්න පුළුවන් වෙන්නේ. එහෙනම් අපි හැමෝම ඉක්මනට දුවමුද ඕක් ගහ ගාවට? "

ඩෑන් පැවසුවේ තරප්පු පෙළ හරහා දිවීමට සූදානම් වෙමිනි. සියලුම දෙනා ඔහු පසුපසින් ගෙවත්තේ ඕක් ගස පාමුලට පැමිණියහ. ඉන්පසුව සියලු දෙනාම අවධානය යොමුකළේ ඕක් ගස අවට පරීක්ෂා කිරීමටයි. ඕක් ගස අසල බිම කිසිඳු හෝඩුවාවක් දක්නට නොලැබුණත් ගස් නැගීමට කොහොමත් සමත් විල් ඕක් ගස දිගේ මුදුනට නැගීමට කැමැත්තෙන්ම ඉදිරිපත් වුණේ ය. ඔහු ඕක් ගස මුදුනට නැග නිවසේ ජනේලයට ආසන්න අත්තට නගින විට පහළ සිට සියලුම දෙනා ඔහු දෙස බලා සිටියහ.

"හෝ... ඔයාලා කීයටවත් විශ්වාස කරන එකක් නැහැ . මේ බලන්නකො මට මොකක්ද හම්බ වුනේ කියල."

ගස මුදුනේ සිට නැවත පහළට බසින අතරතුරේ විල් පැවසුවේ විමතියෙනි. කුතුහලයට පත් සියලු දෙනා ඔහු වටා රොක් වුණේ ඔහු අත තිබෙන්නේ කුමක්දැයි බැලීමටයි.

විල්ගේ අතේ තිබුණේ කුඩා තුණ්ඩු කැබැල්ලකි. එම තුණ්ඩු කැබැල්ල මඩ වැදී තරමක් අපවිත්‍ර වී තිබුණත් එහි සඳහන් වී ඇති දේවල් කියවීමට හැකි තත්වයේ තිබුණේ ය. එම තුණ්ඩු කැබැල්ලේ සඳහන් වී තිබුණේ පරණ පුරාවස්තු කිහිපයක් පිළිබඳව තොරතුරු ය. පිත්තල පහන් ඇතුළු විවිධ පිත්තල නිර්මාණවල නම් සහ මිල ගණන් එහි සඳහන් කර තිබුණි. ඒ වගේම එම තුණ්ඩු කැබැල්ලේ අග ඉතා කුඩා නොපැහැදිලි අකුරින් සටහන් වී තිබූ වෙළඳපොළේ නම කාටත් බොහොම හුරුපුරුදු නමක් විය.

එනම් විලියම්සන්ගේ පරණ බඩු සාප්පුවයි. ඕක් මන්දිරය ආසන්නයේම පිහිටා තිබෙන විලියම්සන් මහතාගේ පරණ බඩු සාප්පුව ගමේ සියළුම දෙනා හොඳින් දන්නා කියන ස්ථානයකි. මේ පුංචි ගමේ ඔහුට පරණ බඩු සඳහා ලොකු වෙළඳාමක් නොතිබුණත් පරණ බඩු එකතු කිරීම විනෝදාංශයක් කරගත් ඔහු එම පරණ බඩු සාප්පුව පවත්වාගෙන ගියේ විනෝදයට ය. නිතර දෙවේලේ පාරිභෝගිකයන් පැමිණියේ නැති වුනත් ඉඳලා හිටලා ගමට පැමිණෙන විදේශිකයින් විලියම්සන්ගේ පරණ බඩු සාප්පුව නොවරදවාම නරඹන ස්ථානයක් බවට පත්වී තිබුණි.

එම තුණ්ඩු කැබැල්ල දුටු සියලු දෙනා මුහුණට මුහුණ බලා ගත්තේ පුදුමයට පත්ව යි. තුණ්ඩුවේ සඳහන් දේවල් සහ සිදුවූ සොරකම අතර පවතින සබඳතාවය සියලුම දෙනාට පැහැදිලි විය.

"ඔයාලට තේරෙනවා නේද මොකක්ද මේ තුණ්ඩුවයි සොරකමයි අතර තියෙන සම්බන්ධය කියලා. මේ තුණ්ඩුවේ තියෙනවා වගේ පිත්තල බඩු භාණ්ඩ කිහිපයක්ම තමයි මේ හොරකමෙන් නැතිවෙලා තියෙන්නෙ. ඉතින් මේ තුණ්ඩුවේ ඒ පුරාවස්තු ගැනයි, ඒවගේ මිල ගණන් ගැනයි සඳහන් වෙලා තියෙනවා. හොරෙකුට වැදගත් වෙන්නේ ඒ පුරාවස්තුවේ මිල ඇරෙන්න වෙන කිසිම දෙයක් නෙමෙයි. ඒ වගේම මේ කියල තියෙන විලියම්සන්ගේ පරණ බඩු සාප්පුවත් ඒ වගේ පරණ බඩු ගැන ඉගෙනගන්න කෙනෙකුට හොඳටම ඉගෙන ගන්න පුළුවන් තැනක්. මම හිතන්නේ විලියම්සන් මහත්තයාගෙන් මේ හොරා මේ පුරාවස්තුවල මිල ගණන් අහගෙන තමයි මේ හොරකම කරන්න ඇවිත් තියෙන්නෙ. කලබලේට මෙතැනින් යනකොට මේ තුණ්ඩු කෑල්ල මෙතන අමතක වෙලා යන්න ඇති. කොහොමත් ඇඩම්ස් නෝනා කෑ ගහගෙන පහලට එනකොට හොරාත් කලබල වෙලා පහල තට්ටුවේ හැංගිලා ඉඳලා හෙමීට උඩ තට්ටුවේ ගබඩා කාමරෙන් ආයෙමත් ගහේ අත්තට පැනලා එතනින් එළියට දුවලා යන්න ඇති."

ඇලිස් පැහැදිලි කළා ය.

"එහෙනම් අපි ඊළඟට කරන්න ඕනේ විලියම්සන් මහත්තයාව මුණගැහෙන්න යන එක. මේ වගේ දේවල් ගැන විලියම්සන් මහත්තයාගෙන් ඇහුවේ කවුද කියල අපි හොයා ගන්න ඕනේ. ඒ සාප්පුවට නිතර නිතර මිනිස්සු එන්නෙ නැති නිසා විලියම්සන් මහත්තයාට ඒ කවුරු වුණත් හොඳට මතක තියේවි."

විල් පැවසුවේ ය.

"මට නම් හිතෙන්නේ අපි දැන් මේ අභිරහස විසඳන්න හොඳටම ලඟයි. හිතුවාට වඩා ඉක්මනින් අපි මේ අභිරහසට උත්තර හොයා ගනීවි"

සියලුදෙනාත් සමගම ඕක් නිවසෙන් පිටව යන අතරේ සූසන් සතුටින් සිනහසුනි.

# 4. සාක්ෂි පිටුපස

මිතුරු පිරිසට විලියම්සන් මහතා මුණගැසීමට පරණ බඩු සාප්පුවට යාමට හැකිවුනේ පසු දිනයේදීයි. එදා හවසම ඔවුන්ට විලියම්සන් මහතාව මුණගැසීමට යන්න අවශ්‍ය වුණත් හවස් වරුවේ විලියම්සන් මහතාගේ සාප්පුව විවෘත කර නොමැති බව මිතුරන්ට මතක් වූයේ ඉන්පසුවයි. පසුදින සියලුම දෙනා නැවතත් විලියම්සන් මහතාගේ සාප්පුව අසල සෙල්ලම් පිට්ටනියට එක් වුණෙ මහත් වූ කුතුහලයෙනි .

"මේකයි, මට නම් හිතෙන්නෙ මේ හොරකම කරන්න ඇත්තේ මේ පවුලට ගොඩක් ලඟින් ඉන්න කෙනෙක්." විල් පැවසුවේ කල්පනා කල්පනාකාරීව යි.

"ඇයි ඔයා එහෙම කියන්නේ විල්?" ඇලිස් විමසුවා ය.

"නැහැ ඇලිස්. මේ හොරා කවුරු වුණත් හැම දෙයක් ගැනම හොඳින් දැනගෙන ඉඳලා තියෙනවා. සෙනසුරාදා උදේ ඩෙයාර් නෝනයි මහත්තයයි ගෙදර නැහැ කියලත් දැනගෙන ඉඳලා තියෙනවා. සෑම් නෑ කියලා දැනගෙන ඉදලා තියෙනවා. එයාලා ගෙදර ඉන්න වෙලාවක කිසිම කෙනෙක් මේ වගේ දෙයක් කරන්න ඉදිරිපත් වෙයි කියලා මම නම් හිතන්නේ නැහැ. ඒ වගේම මේ හොරා ඕක් නිවස ගැන හොඳින් දන්න කෙනෙක් වෙන්නත් ඕනෙ. ඕක් ගහේ අත්ත දිගේ ගිහින් කෙළින්ම උඩ තට්ටුවේ ගබඩා කාමරේට යන්න පුළුවන් කියලා මේ හොරා දැනගෙන ඉදල තියෙනවා. ඒ වගේම ඒ ගබඩා කාමරේට අගුලක් නැහැ කියලත් දැනගෙන ඉඳලා තියෙනවා. මෙච්චර දවසක් අපි සෙල්ලම් කරන්න ගිහිල්ලත් ඒ දේ ගැන දැනගෙන හිටියේ නැහැනේ. අඩුම තරමේ ඇලිස්ටවත් ඒක එක එකපාරටම මතක් වුණේ නැහැ. ඒ වගේම ඒ කාමරයේ ජනේලයටයි දොරටයි අගුලක් නැහැ කියලත් දැනගෙන ඉන්න ඕනෙ. ඊටත් වඩා මේ පවුල සතුව තියෙන පරණ පුරාවස්තු පිළිබඳවත් දැනගෙන ඉන්න ඕනෙ. ඉතිං මේ පවුලේ ළඟම හිතවතෙක් තමයි මේ හොරකම කරලා තියෙන්නේ කියලයි මට නම් හිතෙන්නෙ."

විල් පැවසූ දේට සියලු දෙනාම එකඟ වූහ.

"හරි... හරි... අපිට මේ හැම ප්‍රශ්නෙකටම උත්තර හොයාගන්න පුළුවන් තව ටික වෙලාවකින්. දැන්නම් විලියම්සන් මහත්තයා සාප්පුවට වෙලා ඇති. මොකද කියන්නෙ, අපි ඉක්මනින්ම යමු නේද? "සූසන් පැවසුවා ය.

සියළු දෙනාම විලියම්සන් මහතාගේ පරණ බඩු සාප්පුවට දිව ගියහ. වයස අවුරුදු හැත්තෑපහක් පමණ වූ විලියම්සන් මහතා පත්තරයක් කියවමින් අසුනක දිගා වී සිටියේ ය. එක්වරම හඳුනාගන්නට නොහැකි වුණත් ළමයින් පිරිස දුටු විට විලියම්සන් මහතාගේ මුහුණ සිනහවකින් ඔපවත් විය. ඔහු ඒ තරමටම කුඩා දරුවන්ගේ ඇසුර ප්‍රිය කළේ ය.

"දෙයියනේ, ඔය ළමයින්ව දැකපු කාලයක්. එන්න ඇතුලට... පරණ බඩු ගැන දැනගන්න ඔය පොඩි ළමයිනුත් කැමතියි කියලා මම අදනෙ දන්නෙ." විලියම්සන් මහතා පැවසුවේ සිනාසෙමිනි.

ඔහුගේ කාරුණික ආරාධනය පිළිගත් සියලුම දෙනා සාප්පුව තුළට ඇතුළු වුණේ ඔහුට සිනහවකින් සංග්‍රහ කරමිනි.

“මේ වෙලාවේ වෙන වැඩක් නැති නිසා පරණ බඩු සාප්පුව පැත්තෙ ඇවිත් යන්න හිතුනා. අපිට හිතුනා විලියම්සන් මහත්තයා විවේකයෙන් ඇති කියලා. ”

ඩෑන් පැවසුවේ ය. ඒ ඇසූ විලියම්සන් මහතා සතුටෙන් සිනහසුණේ ය.

“මමත් ඇත්තටම හිටියේ හරි කම්මැලිකමින් තමයි. අද උදේ ඉඳන් එක්කෙනෙක්වත් සාප්පුවට ආවේ නැහැ.”

විලියම්සන් මහතා පැවසුවේ ය.

“පහුගිය කාලෙ නම් නිතර දෙවේලේ කීපදෙනෙක්ම ඇවිත් යන්න ආවා. ඒ වුනාට දැන්නම් කිසිම කෙනෙක් නැහැ.”

විලියම්සන් මහතා දොර දෙස බලා දිගු සුසුමක් හෙළුවේ ය. මිතුරන් සියලු දෙනා මුහුණට මුහුණ බලා ගත්තේ විලියම්සන් මහතාගේ මුවින් පිටවුණු ඒ වචනය නිසා යි. අවස්ථාවෙන් ප්‍රයෝජනයක් ගැනීමට සිතූ විල් එක්වරම කටහඬ අවදි කළේ ය.

“පහුගිය කාලේ විලියම්සන් මහත්තයාගේ සාප්පුවට ගොඩක් කට්ටිය යනවා එනවා අපි දැක්කා. පහුගිය කාලේ නම් හොඳ වෙළඳාමක් තියෙන්න ඇති නේද? ”

“ඔව්. වෙළඳාමකුත් තිබුණෙ නැතුවාම නෙමෙයි. ඒ වුණාට ගොඩක් අය මෙතනට එන්නේ බඩු මිලදී ගන්නවාට වඩා බඩු මුට්ටු ගැන අහගන්නනේ. පහුගිය කාලයේ ආවෙත් ඒ වගේ කිහිපදෙනෙක් තමයි.” විලියම්සන් මහතා පැවසුවේ ය.

“ඇත්තද.... කවුද ඉතින් ඒ පරණ බඩු ගැන එච්චර ලොකු ඕනෑකමක් තිබුනු කට්ටිය? මේ කාලෙ ගොඩක් කට්ටිය පරණ බඩු ගැන හොයන්නේ නැහැනේ. ඒ වුනාට මම නම් හිතන්නේ මේ පරණ පුරාවස්තු ගැන ඉගෙන ගන්න එක ගොඩක් රසවත් දෙයක් කියලා.” ඇලිස් පැවසුවේ ප්‍රියමනාපව විදිහට යි.

“ඇත්තටම ඔව් දරුවෝ. මේක නම් ගොඩක් රසවත් දෙයක්. ඒකනේ මෙච්චර වයසට ගිහිල්ලත් මම මේ සාප්පුව ඇරගෙන ඉන්නෙ. ඒ වගේම උනන්දුව වුවමනාව තියෙන කට්ටියක් තමයි මට පහුගිය ටිකේම මුණගැහුණේ. ඇත්තම කිව්වොත් විදේශිකයෙකුත් ආවා. ඒ මහත්තයා නං ආවෙ බඩු බඩුමුට්ටු කිහිපයක් මිලදී ගන්න තමයි. ඒ මහත්තයත් මේ ගැන ගොඩක් උනන්දුව තියෙන්නේ කෙනෙක්.”

“ඇත්තද? කවුද ඒ කෙනා?” ඩෑන් සාමාන්‍ය ආකාරයට පැවසුවත් ඔහුගේ කටහඬේ පැවති චකිතය සියලුදෙනාටම හඳුනාගැනීමට හැකි විය.

“ඇමෙරිකාවේ මහත්තයෙක්. මේ පැත්තේ සංචාරය කරන අතරේ අහම්බෙන් වගේ තමයි ආවෙ. මෙහේ හිටියෙ නං ටික දවසයි. ඒ ටික දවස පුරාවටම ඇවිත් ගියා. මට මතක විදිහට මීට දවස් හතරකට විතර කලින් තමයි ඒ මහත්තයා මෙහෙන් ගියේ.”

විලියම්සන් මහතාගේ ප්‍රකාශයෙන් සියලු දෙනාට ඇතිවුණේ සහනදායි හැඟීමකි. හොඳින් දන්නා අඳුනන කෙනෙක් පිළිබඳව විස්තරයක් බලාපොරොත්තුවෙන් සිටි ඔවුන්ට නොදන්නා විදේශිකයෙකු පිළිබඳව සෙවීමට සිදුවුණොත් එය විශාල ගැටලුවක් වේවි යැයි සිතුණි.

"ඉතින් තව කවුද මෙහේ ඉන්නෙ පුරාවස්තු ගැන එච්චර ලොකු උනන්දුවක් දක්වන අය?" ජෙසී විමසුවා ය.

"ඇයි ඔයාලා හොඳටම දන්න කෙනෙකුත් ඉන්නවා. ඔයාලා දන්නෙ නැද්ද හෙක්ටර් මහත්තයත් මේ වගේ දේවල් ගැන උනන්දුයි කියලා. ඔය දරුව නම් හෙක්ටර් මහත්තයාව අනිවාර්යෙන්ම දන්නවා ඇති."

විලියම්සන් මහතා ඇලිස් දෙස බලමින් පැවසුවේ ය .

"ඕක් නිවසේ සේවය කරන ඇඩම්ස් නෝනාගේ සැමියා තමා හෙක්ටර් මහත්තයා කියලා කියන්නෙ."

එක්වරම සූසන්ට මහ හඬින් කැස්සක් පිට වුණි . සියලුදෙනාම ඇය දෙස රවා බැලුවේ විලියම්සන් මහත්තයාට කුමන හෝ සැකයක් ඇති වුනොත් තවත් ඔහුගෙන් තොරතුරු දැනගැනීමට නොහැකි වෙතැයි සිතාය.

"එහෙමද?, මම දැනගෙන හිටියේ නැහැනේ හෙක්ටර් මහත්තයත් උනන්දුයි කියලා පරණ බඩු ගැන කියලා. ඉතින් මොනවා ගැනද හෙක්ටර් මහත්තයා ඇවිත් ඇහුවේ? "

ඇලිස් ඇසුවේ කිසිදු වෙනසක් නොතේරෙන ලෙසය.

"ඉන්න මතක් කරන්න. මට මතක විදිහට හෙක්ටර් මහත්තයා ගොඩක් කැමතියි පිත්තල බඩු භාණ්ඩ ගැන තොරතුරු හොයන්න. ඉස්සර තරුණ කාලේ හෙක්ටර් මහත්තයා ළඟ ඒ වගේ බඩු එකතුවක්ම තිබිල තියෙනවලු. මගෙන් පහුගිය දවස් ටිකේම ඒ දේවල් ගැන තමයි ඇහුවෙ. ඇත්තටම හෙක්ටර් මහත්තයත් එක්ක ඒ දේවල් ගැන කතා කරලා මමත් ලොකු විනෝදයක් ලැබුවා."

"එහෙනම් මේ ලඟදි වෙන්න ඇති හෙක්ටර් මහත්තයා නිතර නිතර විලියම්සන් මහත්තයාව මුණගැහෙන්න එන්න ඇත්තේ."

ඇලිස් පැවසුවා ය.

"ඇත්තටම ගොඩ දවසක ඉඳලා නම් නෙමෙයි එන්න පටන්ගත්තෙ. මීට සතියකට විතර කලින් ඉඳලා සැරින් සැරේ ඇවිත් මගෙන් විස්තර ඇහුවා. පහුගිය දවස්වල හෙක්ටර් මහත්තයත් විවේකයෙන් හිටියනෙ. ඒ කාලෙ මගෙත් එක්ක මේ සාප්පුවේම තමයි කාලය ගත කළේ. පහුගිය සිකුරාදා මුළු දවසම හිටියේ මගෙත් එක්ක. මතක විදිහට සෙනසුරාදා උදේ වරුවේත් ආවා. එදා නම් වෙන කිසිම කෙනෙක් ඇවිත් හිටියේ නැහැනේ මගේ බඩු ගන්න.

ඒ නිසා මම දවසම හෙක්ටර් මහත්තයත් එක්ක කතා කරන්න බලාගෙන හිටියේ. ඒ වුනාට හදිසි වැඩක් කියලා හෙක්ටර් මහත්තයා මෙහෙන් පිටවෙලා ගියා උදේ නවය හමාරට විතර."

අවශ්‍ය සියළුම තොරතුරු විලියම්සන් මහතා ලබාදෙන ආකාරය පුදුම සහගතය. මිතුරන් පිරිසගේ සිත්වල හෙක්ටර් මහතා පිළිබඳව ගොඩනැගී තිබුණේ සාධාරණ සැකයකි. සියලු දෙනාටම විලියම්සන් මහතාගේ සාප්පුවෙන් ඉක්මනින්ම පිටතට ඇවිත් මේ පිළිබඳව කතා කිරීම කිරීමට අවැසි වුණත් තවත් මොහොතක් විලියම්සන් මහතාත් සමඟ ගත කළ සියලු දෙනා සාප්පුවෙන් පිටතට පැමිණියහ.

"ඉතින් ගොඩක් පුදුම හිතෙන තොරතුරු අපිට දැනගන්න ලැබුණා නේද? මේ ගැන ඔයාලට මොනවද හිතෙන්නෙ?" පිටතට පැමිණි වහාම ජෙසී ඇසුවා ය.

"ඔව්, මේක නම් ගොඩක් පුදුම හිතෙන කතාවක් තමයි. ඔයාලා හැමෝටම හිතෙන විදිහට මේ හොරකම කරලා තියෙන්නේ කවුද?"

විල් ඇසුවේ සියලුදෙනාගෙන්ම ය.

"මේකයි මට නම් හිතෙන්නේ අපි හරි තොරතුරක් නැතුව කිසිම කෙනෙක්ව ස්ථිර වශයෙන්ම වැරදිකාරයා කරන්න හොඳ නැහැ. ඒ වුනාට තියෙන සාක්ෂිත් එක්ක ලොකුම සැකකාරයා කියලා අපට හෙක්ටර් මහත්තයාව ගණන් ගන්න පුළුවන්."

ඇලිස් පැවසුවේ මද වේලාවක් කල්පනා කිරීමෙන් පසුවයි.

"ඔව් ඇලිස් කියන කතාව හරි. එහෙනම් අපිට දැන් කරන්න තියෙන ලේසිම වැඩේ තමයි හෙක්ටර් මහත්තයාගේ පිටිපස්සෙන් ගිහින් බලන එක. හෙක්ටර් මහත්තයත් එක්ක කතා කරන්න වෙලාවක් ලැබුණොත් හොඳයි." ඩෑන් පැවසුවේ ය.

"හෙක්ටර් මහත්තයා කියන්නේ එච්චර වැඩ රාජකාරි තියෙන කෙනෙක් නෙමෙයි නේ. ඒ නිසා අපිට එයත් එක්ක කතාබහ කරන්න ලැබේවි. ඒ වුනාට අපි ගොඩක් පරිස්සමින් කතා කරන්න ඕන. අපි මේ සිදුවීම ගැන හෙක්ටර් මහත්තයා සැක කරනවා කියලා කීයටවත් එයාට නොතේරෙන්න ඕනෙ." සූසන් පැවසුවා ය.

"හොදයි... එහෙනම් අපි හෙටම යමු නේද හෙක්ටර් මහත්තයාව මුණගැහෙන්න? මොකද කියන්නෙ... "

විල් පැවසුවේ සිනහවක්ද සමඟයි.

"ඔයාලා හැමෝටම බයිසිකල් තියෙනවා නේද? හෙක්ටර් මහත්තයාගේ ගෙවල් පැත්තට බයිසිකල්වලින්ම යමු. කාලෙකට පස්සේ අපට හොඳ සවාරියක් යන්නත් පුළුවන්"

විල්ගේ අදහසට සියලුම දෙනා එකඟ වුණේ මහත් සතුටිනි.

# 5. සොරා කවුද?

පසුදින උදෑසන අටට පමණ සියලුම දෙනා හෙක්ටර් මහතාගේ නිවසට යාමට එක් වූහ. මිතුරන් සියලුම දෙනා තමන්ගේ බයිසිකල් රැගෙන පැමිණියේ සතුටිනි. අභිරහස කෙසේ වෙතත් කාලයකට පසු බයිසිකල්වලින් එකට ගමනක් යාමට ලැබීම මිතුරන් සියලු දෙනාටම විශාල සතුටක්වී තිබුණි. ඒ අතර සූසන් අත වූ වේවැල් පෙට්ටියද සියලුම දෙනාගේ සතුටට තවත් හේතුවක් වී තිබුණි.

"අපේ අම්මා කිව්වා ටිකක් දුරකට බයිසිකල්වලින් යන්න හදන නිසා අපට කෑමබීම මොනහරි අරගෙන යන්න කියලා. අපිට පුළුවන් හොඳ පික්නික් එකක් යන්න." සූසන් පැවසුවේ සිනහමුසු මුහුණිනි.

"ඒක නම් හොඳ අදහසක්. සූසන්, ඉතින් මොනවද ඔය පෙට්ටියේ තියෙන්නේ." ඩෑන් විමසුවේ ය.

"මේ දවස් ටිකක් රස්නෙ නිසා අපේ අම්මා සීතල දෙහි බීම බෝතල් පහක්ම දාල ඇති. තව චීස් සැන්ඩ්විච්ස්, පලතුරු කේක්, පැණිරස කෑම මල්ලක් එක්කම ඇපල්, දොඩම්, මිදි වගේ පලතුරු මල්ලකුත් දාලා තිබ්බා. ආ... තව ගෙදරම හදපු රසම රස කුකීස් ගොඩකුත් තියෙනවා." සූසන්ගේ වදන්වලින් සියලුම දෙනාගේ කටට කෙළ ඉනුවේ නිරායාසයෙනි.

"කියද්දිත් පුදුම ආසාවක් දැනෙන්නේ." විල් පැවසුවේ විශාල සිනහවක්ද සමඟයි.

"හොඳයි හොඳයි, අපට පුළුවන් පස්සෙ කන්න. එහෙනම් අපි හැමෝම දැන් යමු නේද?" ඇලිස් ඇසුවා ය.

සියලු දෙනාම බයිසිකල්වලින් හෙක්ටර් මහතාගේ නිවස පිහිටි ප්‍රදේශය වෙතට පැමිණියේ මහත් වූ ප්‍රීතියෙනි. පැයක පමණ කාලයක් සියලුම දෙනා දොඩමළු වෙමින්, විහිළු තහළු කරමින් පැමිණියහ. ඒ අතර අභිරහස පිළිබඳව කථා කිරීමටත් මිතුරන්ට ඉස්පාසුවක් ලැබුණි.

"හරි ... හැමදේම ලේසි වෙන්න අපි මේ අභිරහස ගැන හෙක්ටර් මහත්තයාගෙන් අහන්නේ මොනවද කියලා තීරණය කරගෙන ඉන්න ඕනෙ. නැත්නම් එතෙන්ට ගිහින් අපි ප්‍රශ්න අහද්දි පැටලුනොත් හෙක්ටර් මහත්තයාට අපි ගැන සැක හිතෙන්න පුළුවන්.

ඩෑන් යොමුකළ වැදගත් පැනය වෙත සියලුම දෙනාගේ අවධානය යොමුවිය.

"හොඳයි... අපට හෙක්ටර් මහත්තයාව මේ ගැන සැක කරන්න සාක්ෂි ගොඩක් තියෙනවනෙ. පරණ බඩු, විලියම්සන් මහත්තයාගෙන් ඒ ගැන අහපු එක ගැන අපි හෙක්ටර් මහත්තයාගෙන් දැනගන්න ඕනෙ. ඒ වගේම ඕක් නිවසේ වුණ මේ හොරකම ගැන හෙක්ටර් මහත්තයට හිතෙන්නේ මොනවද කියලත් අපි දැන ගන්න ඕනෙ. ඒ ගැන ප්‍රශ්න කරද්දී හෙක්ටර් මහත්තයාගේ මූණේ මොනවාම හරි වෙනසක් මතු වෙනවද කියලත් අපි අවධානයෙන් ඉන්න ඕනෙ.

විශේෂයෙන්ම හෙක්ටර් මහත්තයා ඕක් නිවස ගැන මොනවගේ තොරතුරුද දන්නේ කියන එකත් ගොඩක් වැදගත්. ඊටත් වඩා පසුගිය සෙනසුරාදා දවසෙ හෙක්ටර් මහත්තයා හිටියේ කොතැනද, මොනවද කළේ කියන එකත් අපි දැනගන්න ඕනෙ. මේ දේවල් කිසිම සැකයක් ඇති නොවෙන විදිහටයි අපි අහන්න ඕනේ"

ජෙසී පැවසුවා ය.

"ඔව්. ජෙසී කියපු දේවල් ටික තමයි අපි හෙක්ටර් මහත්තයගෙන් අහන්න ඕනි. අපි විලියම්සන් මහත්තයාගෙන් සැකයක් ඇති නොවන විදිහට තොරතුරු ඇහුවා වගේ හෙක්ටර් මහත්තයාගෙනුත් අහන්න ඕනෙ. අපි ඕනෑවට වඩා හාරා අවුස්සන්න ගියොත් හෙක්ටර් මහත්තයාටත් සැකයක් ඇතිවෙන්න පුළුවන්. මොකද අපි අතරෙ ඉන්නවනෙ ඇලිස්. අපි හොරකම ගැන ගොඩක් උනන්දුවෙන් ඉන්නේ කියල හෙක්ටර් මහත්තයා කොහොමටත් දන්නවා." විල් පැවසුවේ ය.

"ඔව්, අපට පුළුවන් අපි ඇඩම්ස් නෝනව බලන්න ආවා කියලා එහෙට යන්න. මම දන්න තරමින් මේ වෙලාවෙ නම් ඇඩම්ස් නෝනා ගෙදර ඉන්නවා වෙන්න බැහැ. මොකද මේ වෙනකොට ඇඩම්ස් නෝනා අපේ ගෙදරට ඇවිත් ඇති. උදේ අම්මා එහෙම කතාවක් කියනව මට ඇහුනා. ඒත් අපි ඒක නොදන්න ගානට ගිහින් හෙක්ටර් මහත්තයාව කතාවට අල්ල ගමු." ඇලිස් පැවසුවා ය.

"ඔව්, ඇලිස් කියන කථාව හරි. එහෙනම් අපි ඒ විදිහට කරමු." සියලු දෙනාම එකඟ විය.

---

සියලු දෙනා හෙක්ටර් මහතාගේ නිවස වෙත ළඟා වන විට හෙක්ටර් මහත්මයා නිවසේ සිටීම කාගෙත් සහනයට හේතුවිය. මිතුරු පිරිසගේ බයිසිකල් හෙක්ටර් මහතාගේ නිවසේ මිදුලේ නවත්වන විට හෙක්ටර් මහතා සිටියේද මිදුලේ කොණකට වී වත්ත පිටියේ වැඩක් සිදු කරමිනි. මිතුරන් පිරිස දුටු ගමන්ම ඔහුගේ මුහුණේ මතු වූ විමතිය සියලදෙනාටම පැහැදිලිවම දැකගත හැකිවිය. නමුත් ඒ පිළිබඳ කිසිඳු වෙනසක් නොපෙන්වූ මිතුරු පිරිස හෙක්ටර් මහතා වෙත පැමිණියේ සිනහමුසු මුහුණෙනි.

"සුභ උදෑසනක් හෙක්ටර් මහත්තයා." සූසන් පැවසුවේ ප්‍රියමනාප ලෙසයි.

"සුභ උදෑසනක්. ඔය ඉන්නෙ ඕක් නිවසේ ළමයයි, එයාගේ යාළුවෝ ටිකයි නේද? සෑහෙන කාලෙකින් දැකපු නිසා නිසා මට අඳුනගන්නත් බැරි උනා. මේ ළමයි මොකද මේ පැත්තෙ?" හෙක්ටර් මහතා විමසුවේ ය.

"මේ පැත්තට නම් අපි ආවේ බයිසිකල්වලින් පික්නික් එකක් යන්න. ඒ යන ගමන් ඇඩම්ස් නෝනාවත් බලාගෙනම යන්න ඕනෙ කියලා හිතුනා. ඇඩම්ස් නෝනව දැන් ටික දවසකින් දැක්කෙවත් නැහැ." ඇලිස් පැවසුවාය.

“අනේ ළමයෝ... එයා ඔය දරුවගේ ගෙදරට ගියේ ටික වෙලාවකට කලින්නේ.” හෙක්ටර් මහතා පැවසුවේ ය .

“අනේ එහෙමද? එහෙනම් ගෙදරට ගිහිල්ලම තමයි ඇඩම්ස් නෝනාව බලන්න වෙන්නේ.” ඇලිස් පැවසුවේ දුක්බර මුහුණක් මවා ගනිමිනි.

“මේ වෙලාව නම් ඇත්තටම හොඳයි ඔය ළමයින්ට පික්නික් එකක් යන්න. හොඳට විනෝද වෙන්න පුළුවන්.” හෙක්ටර් මහතා පැවසුවේ ය.

“ඒක තමයි අද අපි මෙහෙට එන්න තීරණය කළේ. ඇඩම්ස් නෝනත් නැත්නම් හෙක්ටර් මහත්තයා එක්කවත් ටිකක් කතා කරලා යමු නේද?” විල් අනෙක් පිරිස වෙතට හැරෙමින් ඇසුවේ ය.

එය ඇසුණු හෙක්ටර් මහතාගේ මුහුණේ මතු වුණේ මේ ළමයින් ඉක්මනින්ම මෙහෙන් ගියා නම් හොඳයි වැනි හැඟීමකි. ඒ හැඟීම සියලු දෙනාටම රහසක් නොවුනත් ඔවුන් කිසිදු වෙනසක් නොපෙන්වා සිටියහ.

“ඒක හොදයි... එන්නකෝ ඇතුළට.” හෙක්ටර් මහතා නිවස දෙසට යමින් පැවසුවේ ය. මිතුරන් සියල්ලෝ ඔහු පසුපසින් නිවස තුළට පිවිසුණහ.

.......................................................................................................................................

හෙක්ටර් මහතා ළමයින්ට සාදා දුන් සිසිල් බීම වීදුරු ද පානය කරමින් මිතුරු පිරිස අසුන්වල වාඩිවී සිටියේ කොයි මොහොතේ කතාව ආරම්භ කරන්නද කියා සිතමිණි. ඒ සමගම විල් එක්වරම කතාවට ආරම්භයක් ලබා දුන්නේ ය.

“මේ පහුගිය ටිකේම කරන්න ඒ තරම් වැඩක් නැති නිසා අපි හරි කම්මැලිකමෙන් ඉන්නෙ. ඒක තමයි අද මේ පැත්තට එන්න හිතුවේ. ඊයේ නම් අපි විලියම්සන් මහත්තයාව මුණගැහෙන්න පරණ බඩු සාප්පුවට ගියා. එතනදි විලියම්සන් මහත්තයා තමයි හෙක්ටර් මහත්තයාව මතක් කලේ. එතකොට තමයි අපිටත් මතක් වුනේ මේ පැත්තට පික්නික් එකක් ආවොත් නම් හොඳයි නේද කියලා.”

විල් පැවසූ වදන්වලින් හෙක්ටර් මහත්තයා තරමක් සසල වන සැටි කාටත් නිරූපණය විය.

“එහෙමද ...ඉතින් මොනවද විලියම්සන් මහත්තයා මං ගැන කිව්වෙ ඔය ළමයින්ට?.”

“එහෙම විශේෂ දෙයක් කිව්වෙ නම් නැහැ. පහුගිය ටිකේ හෙක්ටර් මහත්තයා නිතර නිතර පරණ බඩු සාප්පුවට ආවා කියලා කිව්වා. අපිත් එතකොට තමයි දන්නෙ හෙක්ටර් මහත්තයත් පරණ බඩු ගැන උනන්දුයි කියලා.” සූසන් පැවසුවා ය.

“ආ... ඔව් ඔව්...පරණ බඩු ගැන නම් මමත් ටිකක් විතර උනන්දුයි තමයි.”

හෙක්ටර් මහතා පැවසුවේ ය.

“ඉතිං මොන වගේ පරණ බඩු ගැන ද හෙක්ටර් මහත්තයා උනන්දු?” ඇලිස් පැවසුවේ සාමාන්‍ය ආකාරයට යි.

“එහෙම විශේෂයක් කියලා නැහැ.”

“ඒ උනාට විලියම්සන් මහත්තය නම් කිව්වේ හෙක්ටර් මහත්තයා පිත්තල වගේ දේවල් ගැන තමයි ටිකක් වැඩිපුර උනන්දු වෙන්නේ කියලා.”

ඩෑන් පැවසුවේ ය.

ඒ ඇසූ හෙක්ටර් මහතා පුදුමයට පත් විලසින් ළමයින් දෙසට හැරී බැලුවේ ය.

“එහෙමද ...ඔව් ඔව් ... ඒ ගැනත් උනන්දුයි තමයි.” ඔහු පිළිතුරු දුන්නේ ඒ තරම් ගණනකට නොගෙනයි.

“මම හිතන්නේ හෙක්ටර් මහත්තයාගේ කඩේ පහු ගිය ටිකේ ඇරල නෙමෙයි වෙන්න ඇති තියෙන්න ඇත්තේ. මොකද විලියම්සන් මහත්තයා කිව්වා සෙනසුරාදත් හෙක්ටර් මහත්තයා පරණ බඩු සාප්පුවට ආවා කියලා. වෙනදට සෙනසුරාදාටනේ හෙක්ටර් මහත්තයාගේ කඩේ වැඩි වෙළඳාමක් තියෙන්නෙ.” ඇලිස් පැවසුවා ය.

“මේ ටිකේ මට හිතුන ටික දවසකට කඩේ වහලා විවේකයක් ගන්න. එක දිගට වැඩ කරාමත් ඇඟට හරිම මහන්සීනේ ළමයි. ඒ නිසා තමයි පහුගිය ටිකේ මම කම්මැලිකම යන්නත් එක්ක විලියම්සන් මහත්තයාව මුණගැහෙන්න ගියේ. පහුගිය සෙනසුරාදත් මට මතක විදිහට උදේ වරුවෙ හිටියේ එහෙද කොහෙදෝ.” හෙක්ටර් මහතා උනන්දුවකින් තොරව පැවසුවේ ය.

“එහෙමද? ඇඩම්ස් නෝනත් කියනවා මතකයි මට හෙක්ටර් මහත්තයා දැන් හරියට මහන්සි වෙනවා කියලා. නැත්තන් වෙනදට ඇඩම්ස් නෝනාව අපේ ගෙදරට ඇරලවන්න එන්නේ හෙක්ටර් මහත්තයානේ. පහුගිය ටිකේ ඇයි හෙක්ටර් මහත්තයා නැත්තේ කියලත් මම කල්පනා කළා.” ඇලිස් පැවසුවා ය.

“ඔව් දරුවෝ... ඒ මහන්සිය නිසා තමයි මම එහෙට නාවෙ. කොහොමත් ඔය කන්ද නැගගෙන යනකොට මට හරි වෙහෙසයි. දැන් ඉතින් අපිට ගොඩක් වයසත් එක්කනෙ.” හෙක්ටර් මහතා පැවසුවේ මඳ සිනහවක්ද සමගිනි.

”ඒක නෙමෙයි, දැන් ඇඩම්ස් නෝනා හොඳින් ඉන්නවා නේද? පහුගිය ටිකේ ඕක් නිවසට වෙච්ච කරදරේ නිසා ඇඩම්ස් නෝනා කොහොමත් හිටියේ හිත කලබලෙන්නේ. දැන්නම් ටිකක් හරි හරි ගිහින් ඇති නේද?” ජෙසී ඇසුවා ය.

“අ... ඔව්, දැන්නම් එයා හොඳින් ඉන්නවා.”

“ඒ හොරකම ගැන තාම වැඩි විස්තර විස්තරයක් හොයා ගන්න බැරි වෙලාලු නේද? ”

“එහෙම කියන්නේ කොහොමද? මේ වෙනකොට ඕක් නිවසේ වැඩ කරන සෑමුත් ඉන්නේ පොලිසියේනේ.”

එම වදන් පවසන විට ඔහුට ඇති වූ කලබල ගතිය ළමයින් සියලු දෙනාටම පැහැදිලි විය.

"තාම සෑම් සැකකාරයෙක් විතරයි නේ. කොහොම වුණත් කවුද මේ ගෙදරට ආපු හොරා කියලා හොයා ගන්නකන් අපේ අම්මාටයි තාත්තාටයි සැනසීමක් නැහැ. ඇයි ආයෙමත් කොයි වෙලේ මේ වගේ දෙයක් සිද්ධ වෙයිද කියන්න බැහැනේ."

ඇලිස් පැවසුවේ කණගාටුදායක මුහුණකිනි.

"කරදර නොවී ඉන්න දරුවෝ. ඉක්මනටම හොරා කවුද කියල හරියටම ඔප්පු වේවි. හෙක්ටර් මහතා එසේ පවසන විට ඔහුට තරමක් ගොත ගැසුණු බව ඇලිස්ට වැටහුණි.

"ඕක් නිවසේ උන මේ හොරකම හෙක්ටර් මහත්තයලටත් ගොඩක් වැදගත් ඇතිනෙ."

විල් පැවසූ වදන්වලින් හෙක්ටර් මහතා බෙහෙවින් කලබල විය.

"අපිට කොහොමද දරුවෝ ඒක වැදගත් වෙන්නේ"

"ඇයි ඉතිං ඇඩම්ස් නෝනා වැඩ කරන්නෙත් එහෙනේ. අනික මේ සිද්ධියට මුහුණ දෙන්න වුණේත් ඇඩම්ස් නෝනටනේ. ඒක තමයි මම අදහස් කළේ. කොහොමත් අපි වගේම හෙක්ටර් මහත්තයලත් ඒ පවුලේ ගොඩක් හිතවත් උදවියනෙ."

"ඔව් දරුවෝ ,ඒකනම් ඇත්ත තමා. අපේ නෝනගේ හිතටත් ඒ කරදරේ මහා බරක් වෙලයි තිබුණේ. මටත් ඒ දේ එහෙමම තමයි ඉතින්. කොහොමත් ඔය ගෙදර පුංචි පුංචි වැඩ කටයුතුවලට ඉස්සර ඉඳන්ම ගියේ මම. ඒ නිසා ඕක් නිවසත් මට මගේම ගෙදරක් වගේ හුරුපුරුදුයි. එහෙම තැනක ඔය වගේ සිද්ධියක් වුණහම ඒ ගැන කොහොමත් කණගාටුයි තමයි." හෙක්ටර් මහතා එම වදන් පැවසුවේ තරමක් නුහුරු ගතියකිකින් යැයි සියලු දෙනාටම සිතුණි.

"ඒක නම් ඇත්ත. කොහොම වුණත් අපට ඉක්මනින්ම මේකේ අවසානයක් බලාගන්න පුළුවන් වේවි." සූසන් පැවසුවා ය.

"අනික කිසිම කෙනෙක් හිතුවෙවත් නැති වෙලාවක නේ ඔය සිදුවීම වුණේ. පොලිසිය කියන විදිහට සෙනසුරාදා උදේ දහය හමාරත් එකොළහත් අතර තමයි හොරකම වෙලා තියෙන්නෙ. කවුරුත් හොරකමක් කරන්න හිතන වෙලාවක්වත් නෙමෙයිනේ. අනික ඒ වෙලාවේ ගෙදර ඉඳලා තියෙන්නෙත් ඇඩම්ස් නෝනා විතරයි."

"ඒක තමයි, අපේ නෝනත් උදේ ගෙදරින් ගියේත් හරි කැමැත්තෙන් සෙනසුරාදා දවසම ඕක් නිවසට වෙලා නිදහසේ ඉන්න පුලුවන් වෙන නිසා. ඒත් මම කිව්වා සෙනසුරාදත් එහෙට නොයා ගෙදරම ඉන්න කියලා. ඒ උනාට ඒකට අපේ නෝනා කැමති වුණේ නැහැ. ඒ නිසා තමයි මමත් එදා උදේ විලියම්සන් මහත්තයාගේ සාප්පුවට ගියේ."

හෙක්ටර් මහතා පැවසුවේ ය.

"ඒ උනාට මුළු දවසම හෙක්ටර් මහත්තයා හිටියේ සාප්පුවේ නෙමෙයි නේද? අපට විලියම්සන් මහත්තයා කිව්වේ උදේ නමය හමාරට විතර හදිසියේම හෙක්ටර් මහත්තයා පිටත්වෙලා ගියා කියලා."

ජෙසී පැවසුවා ය.

"ආ... ඔව්, හදිසි වැඩකට පිටත්වෙලා ගියා තමයි. ඇත්තටම ලොකු හදිසියකුත් නෙවෙයි. මට ගෙදර එන්න ඕනකම තිබුණා. ඉතින් මම කෙළින්ම ආවේ ගෙදරට. දහය හමාර පහු වෙනකොට මං හිටියේ ගෙදර. හිමින් හිමින් පාර දිගේ ඇවිදගෙනනේ ආවේ." හෙක්ටර් මහතා පැවසුවේ ය.

"ආ... එහෙමද අපි හිතුවෙ හෙක්ටර් මහත්තයා කඩේට යන්න ඇති කියලා. ඒ උනාට ගෙදරට නේද ඇවිත් තියෙන්නෙ?." සූසන් ඇසුවා ය.

"ඔව් දරුවනේ, ගෙදර තමයි ආවෙ. දහයයි හතලිහ විතර වෙනකොට මම ගෙදර ආව මට මතක හැටියට. ඊට පස්සේ මම ටිකක් විවේකයෙන් හිටියා. ඒ අතරේ තමයි මේ ගැන දැනගන්න ලැබිලා මට ආයෙමත් ඕක් නිවසට දුවන්න සිද්ධ වුණේ අපේ නෝනව ගෙදර එක්කරගෙන එන්න. එනකොට වෙලාව දොළහට විතර ඇති.

සියලු දෙනා අතර මොහොතක නිශ්ශබ්දතාවයක් පැතිර පැවතුණි.

"එහෙනම් හෙක්ටර් මහත්තයා අපි ගිහින් එන්නම්." විල් පැවසුවේ අසුනෙන් නැගිටිමිනි.

ඔහුව අනුකරණය කළ සියලුම දෙනා අසුන්වලින් නැගීසිට හෙක්ටර් මහතාට සමුදී ඔහුගේ නිවසින් පිටත් විය. බයිසිකල්වලට නැග හෙක්ටර් මහතාගේ නිවස ආසන්නයේම තිබෙන ගංඉවුර වෙතට ඔවුන් ගියේ පුදුම වේගයකිනි. ඒ වන විට උදෑසන එකොළහට ආසන්න වී තිබුනු අතර සියලුම දෙනාට තදින්ම කුසගින්න දැනෙමින් පැවතුණි. ගං ඉවුරට ළංවූ සියලු සියලුදෙනාම බයිසිකල් පසෙකින් නවත්වා ගඟ අසලට ගියහ. ඒ අතර ජෙසී සහ ඇලිස් දිග රෙදි කැබැල්ලක් බිම ඇතිර වූ අතර සූසන් එම රෙදි කැබැල්ල මත වේවැල් කූඩයේ තිබූ ආහාර පිළිවෙලකට ඇසුරුවා ය. ඉන් අනතුරුව සියලුදෙනා එතැනට රැස්ව ආහාර ගනිමින් හෙක්ටර් මහතාගෙන් ලබාගත් තොරතුරු පිලිබඳව වැඩිදුර කතා බහකට යොමු වූහ.

"මේ අහන්නකෝ... අපි දැන් මේ හැමදෙයක්ම හොඳට පැහැදිලි කර ගමු. අපිට හෙක්ටර් මහත්තයාව සැක කරන්න ගොඩක් හේතු තියෙනවා. ඒ වගේම අද කරපු සාකච්ඡාවෙන් ඒ ගොඩක් හේතු ඇත්ත කියලා තහවුරු වුණා."

"ඒක ඇත්ත ජෙසී, හිතල බැලුවම මේ වගේ හොරකමක් කරන්න ලොකුම ඉඩකඩ තියෙන කෙනෙක් තමයි හෙක්ටර් මහත්තයා කියන්නේ. ඇඩම්ස් නෝනා සෑහෙන කාලෙක ඉඳලා ඕක් නිවසේ සේවය කරනවා. ඒ කාලය පුරාවටම හෙක්ටර් මහත්තයත් ඕක් නිවසේ ළඟම හිතවතෙක්. ඉස්සර ඉඳන්ම එහේ හැම පුංචි වැඩකටම ගෙන්නගෙන තියෙන්නෙත් හෙක්ටර් මහත්තයා කියලා එයාම අපිට කිව්වා. ඉතින් ඒ නිසා ඕක් නිවස ගැන හොඳින්ම දන්න කෙනෙක් තමයි හෙක්ටර් මහත්තයා කියන්නේ. ඇඩම්ස් නෝනත් වැඩකරන්නේ ඕක් නිවසේ නිසා නිවසේ තියෙන පරණ පුරාවස්තු ගැන හෙක්ටර් මහත්තයා හොඳින්ම දැනගෙන ඉඳලා තියෙනවා. ඒ වගේම ඒ දේවල් තියෙන්නේ කොතනද කියලත් හෙක්ටර් මහත්තය දැනගෙන ඉඳලා තියෙනවා.

මේ ගෙදර විවිධ වැඩවලට ආවා ගියා නම් මේ ගෙදර ඇතුලේ තියන අර අගුළු දාන්නේ බැරි ගබඩා කාමරය ගැනත් දැනගෙන ඉන්න පුලුවන්නෙ."

"ඔව් සූසන්. මට පුංචි මතකයක් තියෙනවා දවසක් අපේ ගෙදර උඩ තට්ටුවේ අලුත්වැඩියා වැඩකට හෙක්ටර් මහත්තය ආවා. ඉතින් හෙක්ටර් මහත්තයා එදා මුළු දවසම හිටියේ ඔය ගබඩා කාමරේ ආසන්නයේමයි. ඒ වගේම ඒ ගබඩා කාමරේ ඇතුළෙ තියෙන ඕන කරන බඩු මුට්ටු ගන්න ඒක ඇතුලටත් ගියා. ඉතින් ඒ නිසා හෙක්ටර් මහත්තයා ඒ කාමරේ ගැන අනිවාර්යෙන්ම දැනගෙන ඉඳලා තියෙන්න ඕනෙ." ඇලිස් පැවසුවා ය.

"ඒ කොච්චර කාලෙකට කලින් වගේද ඇලිස්?" ඒ පිළිබඳව විල් උනන්දු විය.

"වැඩි කාලයකට කලින් නෙමෙයි විල්. දැන් මාස තුනකට විතර කලින්. ඒ ගැන මගේ හිතටත් තියෙන්නේ ලොකු සැකයක්. අනිවාර්යෙන්ම හෙක්ටර් මහත්තයා අපේ ගෙදර තියෙන ගබඩා කාමරය ගැන දැනගෙන හිටියා. ඒ නිසා කොහොමද ගෙදරට ඇතුළු වෙන්නේ කියන එක එයාට ප්‍රශ්නයක් නොවුණා වෙන්න පුළුවන්. ඒ වගේම අද හෙක්ටර් මහත්තයාම කිව්වා එයා දැනගෙන හිටියා කියල එදා උදේ වරුවේ ගෙදර හිටියේ ඇඩම්ස් නෝනා විතරයි කියලා. ඒ වගේම හෙක්ටර් මහත්තයා ඇඩම්ස් නෝනාවත් ගෙදරම නවත්තලා යන්න උත්සාහ කරලා තියෙනවා. ඒ උනාට ඇඩම්ස් නෝනා වැඩට ගියා. හෙක්ටර් මහත්තයා දැනගෙන හිටියා ඇඩම්ස් නෝනා විතරක් ගෙදර ඉන්න නිසා ලොකු කරදරයක් වෙන්නේ නැහැ කියලා. ඇඩම්ස් නෝනා ගැන කොහොමත් හෙක්ටර් මහත්තයා හොඳටම දන්නවනෙ. ඒ වෙලාවට ඇඩම්ස් නෝනා ටිකක් විවේකයෙන් ඉන්නවා කියල දැනගෙන ඉඳලා තියෙනවා. ඒ නිසා තමයි හරි වෙලාව බලලා කිසිම බයක් නැතුව ගෙදරට ඇතුළු වෙලා තියෙන්නේ. මොකද ඇඩම්ස් නෝන කලින් කියලා තියෙනවා අද උදේ ටිකක් විවේකයෙන් ඉන්න පුළුවන් කියලා."

"ඔයා කියන එක හරි ඇලිස්. ඒ වගේම තමයි හදිසියේ හරි ඇඩම්ස් නෝනා හෙක්ටර් මහත්තයව දැක්කත් ප්‍රශ්නයක් ඇති නොවී බේරෙන්න තිබුණා. මොකද කවදාවත් ඇඩම්ස් නෝනා හෙක්ටර් මහත්තයාව පාවල දෙන්නෙ නැහැ කියල එයා දැනගෙන හිටියා. කීයටවත් ඇඩම්ස් නෝනා මේ හොරකමට හවුල් නැහැ තමයි. ඒ උනාට හදිසියේ හරි හෙක්ටර් මහත්තයාව හොරකම් කරද්දී දැක්කනං හෙක්ටර් මහත්තයාට කොහොම හරි ඇඩම්ස් නෝනව පාලනය කරගන්න තිබුණා." ඩෑන් පැවසුවේ ය.

"අනික හෙක්ටර් මහත්තයාට මේ හොරකම ගැන හොඳ පෙර සූදානමක් තිබුණා. කවදාවත් පරණ බඩු ගැන ලොකු උනන්දුවක් දැක්වුවේ නැති හෙක්ටර් මහත්තයා සතියක් විතර තිස්සෙ ඉඳං විලියම්සන් මහත්තයගේ සාප්පුවට ඇවිත් පිත්තල බඩු ගැන අහලා තියෙනවා. ඒක අහම්බයක් වෙන්න බැහැ. ඒ වගේම හෙක්ටර් මහත්තයා වෙනදා වගේ නිතරම ඇඩම්ස් නෝනාව ඇරලවන්න ඕක් නිවසට ආවෙත් නැහැ.

ඒකත් සමහර සමහරවිට හෙක්ටර්  මහත්තයාගේම සැලසුමක් වෙන්න පුළුවන්. හෙක්ටර් මහත්තයා හැමෝටම පෙන්නුවෙ තමන්ට ටිකක් වෙහෙසයි කියලා. ඉතින් එහෙම වෙහෙසක් තියෙන කෙනෙක් කොහොමටවත් මේ වගේ හොරකමක් කරාවි කියලා කවුරුත්ම හිතන්නේ නැහැ. නිතර නිතර ඕක් නිවස ගාව සැරිසැරුවොත් කාගේත් අවධානය තමන්ට යොමු වෙන්න පුළුවන් කියලා හෙක්ටර් මහත්තය දැනගෙන හිටියා. ඒ නිසා සාධාරණ හේතුවක් ඉදිරිපත් කරලා හෙක්ටර් මහත්තයා ඕක් නිවසට එන එකත් මඟහැරියා. සාමාන්‍ය හොරෙක් වගේ හොරකම කරන්න බලාපොරොත්තු වෙන තැනට නිතර නිතර ඇවිත් තොරතුරු එකතු කරන එක නෙමෙයි හෙක්ටර් මහත්තයා කළේ. පුළුවන් තරම් ඒ තැනට එන්නේ නැතුව ඉන්න එක. එහෙම වුණාම කාගෙවත් සැකයක් තමන්ට ඇති වෙන්නේ නැහැ කියලා හෙක්ටර් මහත්තයා දැනගෙන හිටියා."

විල් පැවසුවේ පලතුරු කේක් කැබැල්ලක් අතට ගනිමිනි.

"ඉතිං අපි සෙනසුරාදා දවසේ වුණ දේවල් ගැන හිතනකොට හෙක්ටර් මහත්තයාම කිව්වා උදේ වරුව ගතකළේ විලියම්සන් මහත්තයාගේ සාප්පුවෙ කියලා. එතැනින් උදේ නවයයි තිහට විතර හෙක්ටර් මහත්තය පිටත් වුණා. විලියම්සන් මහත්තයාට හදිසියක් කියලා කිව්වත් ඇත්තටම හෙක්ටර් මහත්තයා කියන විදිහට හෙක්ටර් මහත්තයා ඇවිත් තියෙන්නේ ගෙදර යන්න. එතැන තමයි මෙතන තියෙන ලොකුම සහ එකම නොගැලපීම. හෙක්ටර් මහත්තයා කියන විදිහට හෙක්ටර් මහත්තයා උදේ නමයයි තිහට විතර විලියම්සන් මහත්තයාගේ සාප්පුවෙන් පිටත්වෙලා දහයයි හතලිහ විතර වෙන කොට ගෙදර ඇවිත් තියෙනවා. ඒ කාලය ඇතුළත පයින් තමයි ඇවිත් තියෙන්නෙ. කොහොමටත් එහෙ ඉඳන් මෙහෙට පයින් එන්න ඒ වගේ කාලයක් ගත වෙනවා කියලා අපිට හිතන්න පුළුවන්. ඒ වෙලාවේ ඉඳන් හෙක්ටර් මහත්තයා ඉඳලා තියෙන්නේ ගෙදර. ඊට පස්සේ ආයෙමත් දවල් දොලහට විතර ඕක් නිවසට ගිහින් තියෙන්නේ උන කරදරය ගැන දැනගෙන."  ඩෑන් පැවසුවේ ය.

"ඇඩම්ස් නෝනා කියන විදිහට මේ හොරකම වෙලා තියෙන්නෙ උදේ දහයයි තිහත් එකොළහත් අතර. උදේ දහයයි තිහට පස්සේ තමයි ඇඩම්ස් නෝනා උඩ තට්ටුවට ගියේ. එකොලහට තමයි මේ සද්දය ඇහිලා නැගිට්ටෙ. ඉතින් එතකොට ඒ කාලය ඇතුලත ඉතාම ඉක්මනින් කරපු හොරකමක් තමයි මේක. මේ හොරකම කළේ හොඳින්ම දන්න කෙනෙක් කියලා අපිට හිතන්න පුළුවන් තවත් තැනක් තමයි ඒක. ඒ උනාට මේ වෙලාවේ ඇත්තටම හෙක්ටර් මහත්තයා හිටියේ කොතැනද කියන එක තමයි අපි ඊළඟට හොයා ගන්න ඕනෙ. හෙක්ටර් මහත්තයා කියන දේ ඇත්ත නම් එයා නෙමෙයි මේ හොරකම කළේ. ඒ වුණත් මට නම් හිතෙන්නෙ හෙක්ටර් මහත්තයා ඒ කිව්වේ බොරුවක් කියලා." ජෙසී පැවසුවාය.

“ඔව් ජෙසී. අනිවාර්යෙන්ම හෙක්ටර් මහත්තයා කිව්වේ බොරුවක්ම වෙන්න ඕනෙ. නැත්නම් මේ  කරුණු කොහොමටවත් එකිනෙකට ගැලපෙන්නේ නැහැ. අපිට හම්බ උන ලොකුම සාක්ෂිය තමයි ඕක් ගහ ගාව තිබිලා හම්බුන තුන්ඩු කෑල්ල. ඒ තුන්ඩු කෑල්ලෙ තියෙන විදිහට විලියම්සන් මහත්තයව මුණ ගැහිලා පරණ පිත්තල බඩු ගැන අහපු එකම කෙනා තමයි හෙක්ටර් මහත්තයා. ඉතින් එතකොට මේ හොරකම කළේ හෙක්ටර් මහත්තයාම කියලා තමයි මට නම් හිතෙන්නේ.” ඇලිස් පැවසුවා ය.

“ඔව් ඇලිස්, ඒක ඇත්ත. අපිට දැන් තියෙන්නෙ හෙක්ටර් මහත්තයා අපෙන් මේ කතාවේ හංගපු කොටස හොයාගන්න. හෙක්ටර් මහත්තයා ඇත්තටම ගෙදර ආවෙ දහයයි හතළිහට ද, එහෙම නැත්නම් එකොළහ පහු වෙලාද කියන එක අපි දැනගන්න ඕන. මේ හොරකම කරපු ගමන් ගෙදර ආව නම්  පිටත් වෙන්න ඕන එකොළහට. ඒ කියන්නේ මෙහෙට එනකොට අනිවාර්යෙන්ම දොළහවත් වෙනවා. ඒ උනාට හරියටම දොළහ වෙනකොටත් හෙක්ටර් මහත්තයා හිටියේ ඕක් නිවසේ.  ඉතින් මට නම් හිතෙන්නේ අනිවාර්යෙන්ම හෙක්ටර් මහත්තයා මේ හොරකම කරලා ඒ අවටම ඉඳලා ආයෙමත් දොළහට ඕක් නිවසට ආවා කියලා.”

සූසන් එසේ පැවසුවා පමණි, එක් වරම අත තිබූ දෙහි යුෂ බෝතලය පසෙකට දැමූ විල් එතනින් නැගිට්ටේ මහත්සේ කලබලයට පත් ව යි. ”මේ අහන්න, ඔයාලට මේක තේරුනේ නැද්ද? මේක මේ කතාවේ ගොඩක්ම වැදගත් කොටසක්.” විල් පැවසුවේ කලබලකාරී හඬකිනි.

“ඒ මොකක්ද විල්?” සියලුම දෙනා ඔහුගෙන් ඇසුවේය එකටයි.

“මේ අහන්න, හෙක්ටර් මහත්තයා කියන විදිහට සහ අපිටත් හිතාගන්න පුළුවන් විදිහට අනිවාර්යෙන්ම ඕක් නිවසේ ඉඳන් හෙක්ටර්  මහත්තයාගේ ගෙදරට පයින් යන්න පැයකට වැඩි කාලයක් ගතවෙනවා. හෙක්ටර් මහත්තයා කියන කථාවේ විදිහටනම් හෙක්ටර් මහත්තයා උදේ නමයයි තිහට එතනින් පිටත් වෙලා පැයකුත් විනාඩි දහයක් ඇතුලත ගෙදරට ආවා. ඉතින් ඒ වගේම හෙක්ටර් මහත්තයා කියපු මේ කතාවේ හෙක්ටර් මහත්තයටම පැටලුන තැනක් තියෙනවා. මොකද හෙක්ටර් මහත්තයා කියන විදිහට එයා ආයෙමත් හරියටම දොළහ වෙනකොට ඕක් නිවසේ හිටියා. හැබැයි එයා අනිවාර්යෙන්ම මේ පණිවිඩේ දැනගත්තේ උදේ එකොළහත් පහුවෙලා. ඉතින් උදේ එකොළහත් පහුවෙලා ඒ පණිවිඩේ දැනගත්තු කෙනා දෙවැනි පාර විතරක් පැයකටත් අඩු කාලයක් ඇතුළත කොහොමද ඕක් නිවසට යන්නේ?  ඒ වෙලාවෙ මේ පාරේ වෙන කිසිම බස් එකක් යන්නේවත් නැහැනෙ. ඒ වගේම මේ පාර වැඩිය වාහන යන පාරක් නෙමෙයි. හෙක්ටර් මහත්තයා ඒ වගේ වාහනයක ගියානම් ඒක අනිවාර්යෙන්ම අපට කියනවා. ඒ වුනාට එහෙම කිව්වේ නැහැනේ. ඒ කියන්නේ අනිවාර්යෙන්ම හෙක්ටර් මහත්තය අපට කියල තියෙන්නෙ වෙනම කතන්දරයක්.

ඒ නිසා අපි දැන් හොයා ගන්න ඕනෙ හෙක්ටර් මහත්තයා හරියටම ගෙදර ආපු වෙලාව දහයයි තිහද එහෙමත් නැත්නම් දොළහත් පහු වෙලාද කියන එක. මොකද හෙක්ටර් මහත්තයාට කොහොමටවත් බෑ මේ පණිවිඩය එකොළහට දැනගෙන දොළහ වෙද්දී ඕක් නිවසට ගිහින් ඉන්න." විල් ගේ දීර්ඝ විස්තරයෙන් සියලුදෙනාම පුදුමයට පත් වූහ.
"ඇත්තමයි විල් ඔයා කියනකම් අපට ඒ දේ නිකමටවත් හිතුනේ නැහැනේ..." ඇලිස් පැවසුවේ විමතියට පත් කටහඬකිනි.
"හොදයි එහෙනම්, අපි දැන් මොකක්ද ඊළඟට කරන්න ඕනෙ?" ජෙසී විමසුවා ය.
"මේ... මේ... හැමදේටම කලින් කාලා ඉවර කරන්න මෙතන ඇති වෙන්න කෑම තියෙනවා. අපි මොනවා කරන්නත් කලින් මේ දේවල් ටික කාලා ඉන්න ඕනෙ. හරිද? දැන් නම් මට හොඳටම බඩගිනියි."
ඩෑන්ගේ වදන් වලින් සියලු දෙනාගේ මුහුණට සිනහවක් මතු විය.
"අපිට දැන් කරන්න තියෙන්නේ මේ ලඟ පාත ඉන්න කෙනෙක්ව මුණ ගැහිලා සෙනසුරාදා හෙක්ටර් මහත්තයා කොයි වෙලාවටද ගෙදර ආවෙ කියල දැන ගන්න. මේ පැත්තේ ඉන්න කට්ටිය ගැන මට නම් ඒ හැටි ලොකු අදහසක් නැහැ. ඒ වුනාට හෙක්ටර් මහත්තයාගේ ගෙදරට අල්ලපු ගෙදර කට්ටිය ඉන්නවා මම දැක්කා. සමහර විට ඒ ගෙදර මිනිස්සු දැනගෙන ඉන්න පුළුවන්." විල් සිහින් හඬින් පැවසුවේ චීස් සැන්විච් පෙත්තක් සපමිනි.
"ආ.... ඒ ගෙදර ඉන්න කට්ටියව මම දන්නවා .ඒ ගෙදර ඉන්නේ එක වයසක මනුස්සයෙක් විතරයි. එයා තනියම ගෙදර ඉන්න කෙනෙක්. ඒ නිසා ගොඩක් වෙලාවට එයාට මතකයක් ඇති. අපි එයාගෙන් අහලා බලන එක හොඳයි." ඇලිස් පැවසුවා ය.
"හොඳයි... හොඳයි ... දැන් එහෙනම් ඉක්මනට කාල ඉමු. අපි ඊට පස්සේ යමු ඒ ගෙදර ඉන්න කෙනාව හම්බවෙන්න. ඊට පස්සේ අපිට තීරණයක් ගන්න පුළුවන් අද අපි මේ අභිරහස විසඳලා ඉවර කරනවද නැද්ද කියන එක ගැන."
ජෙසී පැවසුවේ මහත් වූ ප්‍රීතියෙනි.

..............................................................................................................................................

"ඒ.... ඔයාල දැක්කද කවුද අර එන්නෙ කියල. අර එන්නේ හෙක්ටර් මහත්තයාගේ ගෙදරට අල්ලපු ගෙදර ඉන්න කෙනා නේද? "
සියලු දෙනා  කෑම බීම ගත් තැන පිරිසිදු කරමින් ඉන්න අතරේ සූසන්ගේ කට හඬ ගංඉවුර දෙසින් ඇසුණි. ඒ ඇසුනු සියලුම දෙනා ඇය වෙතට දිව ගියේ මහත් වූ කුතුහලයෙනි.

"ඔව්, මම ඔයාලට කිව්වෙ එයා ගැන තමා. එයා තමයි හෙක්ටර් මහත්තයාගේ ගෙදරට අල්ලපු ගෙදර ඉන්න කෙනා." ඇලිස් පැවසුවේ ගං ඉවුරේ එහා කොනේ සිටි මහළු පුද්ගලයාව පෙන්වමිනි. වයස අවුරුදු හැත්තෑ පහක් පමණ වූ ඔහු තරමක් සැර පරුෂ පෙනුමකින් යුතු පුද්ගලයෙක් බව මිතුරන්ට අවබෝධ විය.ඒ කොහොම වෙතත් ඔහු සමඟ කතා කළා යුතුයැයි අධිෂ්ඨාන කර ගත් මිතුරෝ පස් දෙනා සෙමෙන් සෙමෙන් ආගන්තුකයා වෙතට පිය මැන්නෝ ය.

"සුබ දහවලක් වේවා මහත්තයා." ඔහුත් සමඟ කතා කිරීම නිතරගයෙන්ම තමාට පවරා ගත් විල් සෙමෙන් පැවසුවේ ය. කටහඬ ඇසුණු ඔහු විල් දෙසට හැරුණේ තරමක් විමතියට සහ නොසතුටටපත් පෙනුමකිනි.

"ඔව්. කියන්න." ඔහු පැවසුවේ එතරම් මිත්‍රශීලී නොවන කටහඬකින් ය.

"මට මහත්මයාගේ නම දැනගන්න පුළුවන්?" විල් කවදාවත්ම නැති තරම් සංයමයෙන් යුතුව ඔහුගෙන් ඇසුවේ ය.

"මගේ නම තෝමස්. ඇයි දැන් මගේ නම ඔය ළමයින්ට? මං මේ පළාතේ දැකලවත් නැති ළමයි කට්ටියක් ඔය. ඔය ළමයි මොනාද මේ ගං ඉවුරේ කරන්නේ?" තෝමස් මහතා සැර පරුෂ කට හඬකින් ළමයින් වෙතට කඩා පැන්නේය.

"අනේ නැහැ. අපි මෙහෙට ආවේ පුංචි පික්නික් එකක් යන්න. තෝමස් මහත්තයාගේ ගෙදරට අල්ලපු ගෙදර ඉන්න ඇඩම්ස් නෝනා වැඩ කරන්නේ අපේ ගෙදර. අපි ආවේ ඇත්තටම ඇඩම්ස් නෝනාව බලන්න . ඒ වුනාට මේ වෙලාවේ ඇඩම්ස් නෝනා ගෙදර හිටියේ නැහැ. ඉතින් අපි මෙතනට ඇවිත් කෑම ටික කාල යන්න හිතුවා."ඇලිස් සෙමෙන් පැවසුවාය.

"එහෙමද? ඉතින් දැන් මොකටද මට කරදර කරන්න ආවෙ?"

තෝමස් මහතා පැවසුවේ ගඟ දෙසට හැරිලායි.

"අනේ සමාවෙන්න කරදර කරනවා නම්. අපට පුංචි කාරණාවක් දැනගන්න පුළුවන්ද කියලා බලන්නයි කතා කළේ." විල් ඇසුවේ ය.

"මොකක්ද?" තෝමස් මහතා ඔවුන් වෙතට හැරුණේ පෙරට වඩා උනන්දුවෙනි.

"තෝමස් මහත්තයාගේ ගෙදරට අල්ලපු ගෙදර ඉන්න හෙක්ටර් මහත්තයා අපි හොඳින්ම හඳුනන කෙනෙක්. අපට දැනගන්න පුළුවන් ද පහුගිය සෙනසුරාදා හෙක්ටර් මහත්තයා ගෙදර හිටියද නැද්ද කියලා."

"හෙක්ටර් නං ගෙදර හිටිය වගේ මට මතකයක් නැහැ. ආ... ඔව්, හෙක්ටර් ඒ වෙලාවෙ ගෙදර හිටියේ නැහැ තමයි. උදේ වරුවේ මම වැඩකට හෙක්ටර්ගේ ගෙදරට යනකොට ගෙදර දොරවල් සේරම වහලා දාලයි තිබුණේ. දැන් ඔය ළමයින්ට මොකද ඒ විස්තරයක්?" තෝමස් ඇසුවේ ය.

"එහෙමද? ඇත්තටම කීයට වගේද එදා හෙක්ටර් මහත්තයා ගෙදර ආවේ?"

"එදා උදේම හෙක්ටර් ගෙදරින් ගියා වගේ මට මතක. ඔව්, මං දැක්ක ඇඩම්ස් නෝනත් එක්ක උදෙන්ම හෙක්ටර් ගියා. ඇත්තටම මහ පාන්දර ද කොහෙදෝ ගියේ. ඒ වෙලාවේ මමත් හරියට ඇහැරිලා නෙමෙයි හිටියේ. ආයෙමත් දවල් වරුවෙ නම් මම හෙක්ටර්ව දැක්කෙ නැහැ. මට මතක හැටියට ගෙදර එනකොට දවල් දෙක විතර වෙන්න ඇති. කොහොමත් එදා ඇඩම්ස් නෝනා වැඩ කරන ගෙදර හොරකමක් සිද්ධ වෙලා තිබ්බනේ. පස්සේ වෙලාවක හෙක්ටර් මගෙත් එක්ක කතා කරද්දි කිව්වෙ නම් උදේ කොහෙදෝ සාප්පුවකට වෙලා හිටියා කියලා. ඊට පස්සේ ඇඩම්ස් නෝනවත් අරගෙන ගෙදර ආවා කියල හොරකම සිද්ධ වුනාට පස්සේ. ඔය ළමයින්ට මොකටද ඒ විස්තරයක්?"

"හෙක්ටර් මහත්තයා ඒ කියන්නේ එදා උදේ දහයයි හතළිහට විතර ගෙදර ආවේ නැහැ." ඩෑන්ගේ කටින් පැන්නේ ඉබේටමයි.

"මොන පිස්සු කතාද ළමයෝ... ඒ වෙලාවේ හෙක්ටර් ගෙදර හිටියේ නැහැ කියලා මට හොඳටම සහතිකයි. ඉතින් ඔය ළමයි හෙක්ටර් ඔය තරම් හොඳින් දන්නවා නම් මොකටද ඔය විස්තරයක් මගෙන් අහන්නේ? ගිහින් අහගන්න එකයිනෙ තියෙන්නෙ හෙක්ටර්ගෙන්ම. මං හිතන්නේ අද ඒ මනුස්සයා ගෙදර ඉන්නවා."

"ඔව්. ඇත්තටම අපි හෙක්ටර් මහත්තයාව හම්බ වෙලා තමයි ආවේ. අපට ඒක එයාගෙන් අහන්න බැරි වුනා.  ගොඩාක් ස්තුතියි."

ජෙසී පැවසුවේ තරමක් බියමුසුව යි.

"වෙන වැඩ නැතුවටද කොහෙදෝ වෙන මිනිස්සුන්ගේ දේවල් හොයනවා අපිට කරදර කර කර. දැන් යන්න මෙතනින්... මේ ලස්සනට තියෙන ගංඉවුර නැති නාස්ති කරන්න ඔය හදන්නේ කෑම බීම හැම තැනම දාලා." විවිධ දේවල් මුමුණමින් තෝමස් මහතා කට කොනෙන් බනින අතරේ මිතුරන් පිරිස බයිසිකල් ද රැගෙන ඉක්මනින්  පිටත් වූයේ මහත් කලබලයෙනි.

"අම්මේ...  ඒ  වයසක මනුස්සයාගේ තියෙන නපුරුකම."

බයිසිකල් රැගෙන ගං ඉවුරෙන් පැමිණෙන අතරේ සූසන් පැවසුවේ අමනාපයෙනි.

"ඕවා ගණන් ගන්න එපා සූසන්." ජෙසී සූසන්ගේ උරහිස මතින් අත තැබුවා ය.

"කොහොම වුණත් අපට හුඟක්ම වැදගත් දේ දැනගන්න ලැබුණානෙ. ඒ කියන්නේ හෙක්ටර් මහත්තයා උදේ දහයයි හතළිහට ගෙදර ඇවිත් නැහැ. ගෙදර ඇවිත් තියෙන්නෙ දවල් දෙකත් පහුවෙලා.

ඒ කියන්නෙ මේ හොරකම කරේ හෙක්ටර් මහත්තයා කියන සැකය මේකෙන් තහවුරු වෙනවා කියන එකනේ."  විල් පැවසුවේ ය.

"අපි විතරක් දැන ගත්තට වැඩක් නෑනෙ මේ හොරකම කළේ කවුද කියල. අපි ඔප්පු කරලා පෙන්නන්න ඕනේ සෑම් මේකට වගකියන්න ඕනේ නැහැ කියලා." ඇලිස් පැවසුවා ය.

“ඔව් ඇලිස්, අපි ඒක කරන්න ඕන. ඒ වගේම මේ හොරකමට වැරදිකාරයා හෙක්ටර් මහත්තයා කියන එකත් අපි ඔප්පු කරලා පෙන්වන්න ඕනේ. මෙතනින් එහාට ඒක අපිට අයිති වැඩක් නෙමෙයි. අපි හොයාගත්ත මේ හැම විස්තරයක්ම අපි අදම පොලිසියට කියන්න ඕනෙ.” විල් පැවසුවේ ය.

“ඔයාලට මම කිව්වනෙ මගේ මාමා තමයි මේ මෙහෙ පොලිසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක. අපි මේ ගැන මාමට අදම කියන්න ඕනෙ. අද හවස අපේ ගෙදරදී අපි මාමව හම්බවෙමු. ඊට පස්සෙ අපි මේ ගැන මාමට කියමු. ඊට පස්සේ පොලිසියට පුළුවන් මේ ගැන ප්‍රශ්න කරලා ඇත්ත මොකක්ද කියල හරියටම දැනගන්න. ඊට පස්සේ සෑම් වැරදිකාරයෙක් නෙවෙයි.” විල්ගේ වදන් සියලුම දෙනාට ගෙන ආවේ මහත් වූ සහනයකි.

“හොදයි එහෙනම් අපි ඉක්මනින්ම යමු විල්ගේ ගෙදරට”

සියලුමදෙනා විල්ගේ නිවස වෙතට තරගයට මෙන් බයිසිකල් ධාවනය කළේ ප්‍රීතියෙන් යුතුවයි.

........................................................................................................................................

එදින හවස්වරුවේ මාරුවෙන් මාරුවට විල්ගේ නිවසේදී සොරකම පිලිබදව සොයාගත් සියලුම දේ මිතුරන් පස් දෙනා වෙතින් ඇසීමට විල්ගේ මාමා වූ ජොනතන් මහතාට සිදුවිය. මේ කියන කතාව ජොනතන් මහතාට විශ්වාස කිරීමට අසීරු වුණත් ඕක් ගස අසල තිබී තුණ්ඩුව සොයා ගත් මොහොතේ සිට මේ කුඩා දරුවන් පස් දෙනා කටයුතු කළ ආකාරය පිළිබඳව ජොනතන් මහතා ගේ සිතේ ඇති වී තිබුණේ මහත් වූ ප්‍රසාදයකි. බොහෝ වේලාවක් ඔවුන්ගේ විස්තර කිරීමට සවන්දී සිටි ජොනතන් මහතා අසුනින් නැගී සිටියේ තමන්ගේ අදහස ප්‍රකාශ කිරීමටයි.

“මේ අහන්න, ඔයාලා ගොඩක් හොඳට මේ වැඩේ කරලා තියෙනවා. ඇත්තටම ඔයාල මේ අභිරහස විසඳලා තියෙන විදිහ ගොඩක් හොඳයි. ඔයාලගේ හැම සැකයක්ම හරිම සාධාරණයි. ඉතින් ඒ සැකය හෙක්ටර් මහත්තයා වෙතට එල්ල වෙලා තියෙන නිසා එයාව මේකේ ප්‍රධාන සැකකාරයෙක් කරන එක ගැටළුවක් නෙවෙයි. ඒ වුනාට අපි තාම හරියටම දන්නේ නැහැ මොකක්ද මෙතැන සිද්ධ වුණේ කියලා. හැබැයි කොහොම වුණත් ඔයාලා ගොඩක් වටිනා තොරතුරු රැසක් අපට හොයලා දුන්නා. ඉතින් අපි එහෙනම් හෙක්ටර් මහත්තයා මේකේ වැරදිකාරයා ද නැද්ද කියන එක ගැන හොයලා බලනවා. හෙට වෙනකොට ඒ ගැන හරිම තීරණය ලැබිලා තියෙයි කියලා මම හිතනවා. ඒ වගේම තමයි මම හිතනවා ඔයාල මේ අභිරහස විසඳලා තියෙන නියම විදිහ නිසා ඔයාලගේ සැකය සීයට සීයක් නිවැරදි ඇති කියලත්.”

ජොනතන් මහතාගේ වදන් සියලුම දෙනාගේ සිතට ගෙන ආවේ මහත් වූ ප්‍රීතියකි. හෙට දින උදෑසන වන තෙක් ඉවසීමට මිතුරන් පස් දෙනා තීරණය කළහ. හෙට උදේ වන විට මේ පිළිබඳව තොරතුරක් ලබා දෙන බවට පොරොන්දු වූ ජොනතන් මහතා විල්ගේ නිවසින් පිටත් වී ගියේය.

## 6. අභිරහසේ අවසානය

පසුවදා උදෑසන මිතුරන් නැවත එක්රැස් වුණේ ගමේ පොලිස් ස්ථානයේදී ය. ගමේ පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස මිතුරන් පිරිසට සහ ඔවුන්ගේ දෙමාපියන්ට පණිවුඩයක් ලැබී තිබුණේ එදා උදේ වරුවෙ යි. දෙමාපියන්ගේ සිත්වල යම්කිසි චකිතයක් පැවතියත් මිතුරන්ගේ සිත්වල එවැන්නක් නොපැවතුනේ ඔවුන්ගේ සැකය ඔවුන්ට හොඳින්ම තහවුරු නිසයි.

සුළු මොහොතකින් ඔවුන් හමුවීමට පැමිණි ජොනතන් මහතා සියලු දෙනාව ඇමතුවේ ය. "මේ ඉන්න පොඩි දරුවෝ පස් දෙනාගේ ලොකු හපන්කමක් නිසා අද අපිට දැනගන්න ලැබුණා ඕක් නිවසේ සිදු වුන මේ හොරකම සම්බන්ධයෙන් ඇත්තම වැරදිකාරයා කවුද කියලා. ඉතිං ඊයේ මට මේ දරුවෝ පස්දෙනාගෙන් ලැබුණු තොරතුරු මත අපි කරපු වැටලීමෙන් අපිට සාක්ෂිත් එක්කම හොරා කවුද කියලා අහුවුනා. මේ වෙද්දි අදාළ පුද්ගලයා ඉන්නේ අපේ භාරයේ. මුලින්ම මම කැමතියි මේ වගේ ලොකු බරපතල සිද්ධියක් විසඳපු මේ පුංචි දරුවන් පස් දෙනාටම මගේ ස්තූතිය පිරිනමන්න. ඒ වගේම මේ වෙනකම් මේ සිදුවීමට සැකකරුවෙක් විදිහට නම් වෙලා හිටපු ඕක් නිවසේ සේවකයා වන සෑම් චෝදනාවලින් නිදහස් වෙනවා. ඒ මේ පුංචි දරුවෝ පස් දෙනා නිසා. ඒ වගේම මේ හොරකමෙන් නැතිවුණ ඩෙයාර් පවුලට අයත් පැරණි පුරාවස්තු අපි ආයෙමත් හොයා ගත්තා."

එම වදන් අසන විට මිතුරන් පස් දෙනාගේම මුහුණේ මතුවුණේ ආඩම්බරය මුසු වූ සිනහවකි. එම ආඩම්බරය ඔවුන්ගේ දෙමාපියන්ගේ මුහුණුවලද නොඅඩුව තැවරී තිබුණි. ඩෙයාර් මහතාගේ සහ මහත්මියගේ මුහුණුවල ඒත් සමගම මහත් වූ සැනසීමක්ද ගැබ්වී තිබුණේ මේ අභිරහස නිමාවට පත්වීම පිළිබඳවයි. තවත් වදන් කිහිපයකින් ඔවුන්ව ඇමතූ ජොනතන් මහතා මිතුරන් පස් දෙනා ද සමඟ එතැනින් නික්ම ගියේ පෞද්ගලිකව කතා බහ කිරීමටයි. "මේ හොරකම කරපු විදිහ ගැන අපිට හෙක්ටර් හැම විස්තරයක්ම කිව්වා. ඒ විස්තරවලට අනුව ඔයාල කියපු හැමදේම සීයට සීයක්ම නිවැරදියි. හෙක්ටර් පහුගිය කාලය පුරාවටම මේ හොරකම ගැන ලොකු අවධානයකින් ඉඳලා තියෙනවා. සෙනසුරාදා ඊකට ගැලපෙනම පසුබිමක් ඇති වුණා කියලත් දැනගෙන ඉඳලා තියෙනවා. ඊට පස්සේ හොරකම කරන්න උදේ දහයයි හතලිස් පහට විතර ගෙදරට ඇතුල් උනා. ඒ ඔයාලා කියපු විදිහටම අර ගහේ අත්ත ඔස්සේ ගබඩා කාමරය හරහා. එදා උදේම ඇඩම්ස් නෝනත් එක්කම ගමට ඇවිත් විලියම්සන් මහත්තයාගේ පරණ බඩු සාප්පුවට වෙලා ඉඳලා නමයයි තිහට විතර පිටත්වුණා. ඊට පස්සේ ඒ ආසන්නයේම කාටත් පේන්නේ නැතිවෙන්න ඉඳලා දහය හමාරට විතර ඇඩම්ස් නෝනා ගෙදර දොරවල් වහනවා දැකලා තමයි තවත් ටික වෙලාවකින් උඩ තට්ටුවට පැන්නෙ.

ඊට පස්සේ හොරකම් කරගන්න වැඩි වෙලාවක් ගියේ නැහැ. ඇඩම්ස් නෝනාට පල්ලෙහායින් සද්දයක් ඇහිලා පහලට එනකොටම හෙක්ටර් කෙලින්ම හැංගිලා තියෙන්නේ පඩිපෙළ යට. ඊට පස්සේ ඇඩම්ස් නෝනා ආයෙමත් විසිත්ත කාමරයේ ඉඳන් පරණ බඩු තියෙන කාමරේට ගියපු වෙලාවේ පඩිපෙළ දිගේ උඩට නැගලා ඉක්මනින්ම ගබඩා කාමරය හරහා ආයෙමත් ඕක් ගහ දිගේ බැහැලා එතනින් පැනලා දුවලා තියෙනවා. ඊට පස්සෙ බඩු ටිකත් අරගෙන එහෙම්මම දුවලා තියෙන්නෙ විලියම්සන් මහත්තයාගේ පරණ බඩු සාප්පුව පිටිපස්සෙ තියෙන පුංචි මඩුවට. පහුගිය කාලෙ විලියම්සන් මහත්තයත් එක්ක කතා කර කර ඉන්නකොට ඔය මඩුවට අහම්බෙන් වගේ හෙක්ටර් ගිහිල්ලා තියෙනවා. ඉතින් ඒ මඩුවේ කාටවත් නොපෙනෙන විදිහට බඩු ටික හංගලා ආයෙමත් ඒ අවටම කැරකි කැරකි ඉඳලා දොළහට විතර ඕක් නිවසට ඇවිල්ලා ඇඩම්ස් නෝනවත් එක්කගෙන දෙකට විතර ගෙදරට පිටත් වුණා. ඇඩම්ස් නෝනව ගෙදරට දාලා ආයෙමත් හවස පහට විතර තමයි ඇවිල්ලා බඩු ටික අරගෙන තමන්ගේ ගෙදරට ඇවිත් තියෙන්නේ. ඒ වෙලාවේ ඇඩම්ස් නෝනා නිදාගෙන හිටපු නිසා ඒක දැකලා නැහැ. ඒ බඩු ටික ඒ ගෙදර ඇතුළෙම තිබුණා. අපිට ඒ බඩු සේරම හම්බුනේ ගෙදර පරීක්ෂා කරනකොට. බඩු ටික හම්බ වෙනකම්ම හෙක්ටර් මේ චෝදනාව තදින්ම ප්‍රතික්ෂේප කළා. ඒ වුනාට බඩු ටික හම්බ වුණාට පස්සේ එයාට මුළු කතාවම කියන්න සිද්ධ වුණා. පහුගිය කාලේ හෙක්ටර්ගේ කඩේ ලොකු වෙළඳාමක් තිබිලා නැහැ. ඒකත් එක්ක මුදල් ප්‍රශ්න ගොඩක් තිබිලා තියෙනවා. ඒ නිසා තමයි මේ හොරකම කරලා තියෙන්නේ. හෙක්ටර් ඇත්තටම මේක ලොකු පෙර සූදානමක් සහිතව කරපු හොරකමක්."

ජොනතන් මහතාගේ දීර්ඝ විස්තර කිරීමෙන් සියලූ සියළුම දෙනාට ඇති වුණේ මහත් වූ ප්‍රීතියකි. ඒ ඔවුන්ගේ සියලුම සැකකිරීම් සීයට සීයක්ම නිවැරදි වූ නිසයි.

"ඉතින් ඔයාල මේ කරපු දේට ඔයාලට මම ගොඩක් ස්තුතිවන්ත වෙනවා."

ජොනතන් මහතා පැවසුවේ සිනහවක්ද ඇතුවයි.

"මහත්මයා, එතකොට මොකද වෙන්නේ සෑම්ටයි , හෙක්ටර්ටයි."

"හෙක්ටර්ට ලැබිය යුතු දඬුවම ලැබෙනවා. ඒ වාගේම සෑම් ඒ චෝදනාවෙන් නිදහස් වෙනවා. සෑම්ට ආයෙමත් රැකියාව කරගෙන නිදහසේ ඉන්න පුළුවන්. හෙක්ටර්ට සිරදඬුවමක් වගේ ලොකු දඬුවමක් ලැබෙන එකක් නැහැ. ඒ වුනාට එයාට අනිවාර්යෙන්ම නිසි දඬුවමක් ලැබෙනවා. ඒක ඉදිරියේදී තීරණය වෙයි. ඒ වගේම ඇඩම්ස් නෝනා තමන්ගේ රැකියාවට කරන්නේ මොකක්ද කියන එක එයාගේ තීරණයක්. ඩෙයාර් නෝනගෙවත් මහත්තයගෙවත් කිසිම බලපෑමක් ඇඩම්ස් නෝනට නැහැ. ඒක එයා තීරණය කරාවි. හොඳයි, එහෙනම් දැන් ඔය දරුවෝ මෙතනින් යන්න .ඔයාලා කරපු උදව්ව කවදාවත්ම අමතක වෙන්නේ නැහැ." ජොනතන් මහතාට සමු දුන් සියලු දෙනා එතැනින් පිටත්ව ගියහ.

ජොනතන් මහතාගේ කාමරයෙන් පිටතට යන විටම ඔවුන්ගේ මුහුණටම මුණගැසුණේ සෑම් ය. සෑම් දුටු මිතුරන් පස් දෙනාම එක පොදියට ඔහුව වැළඳ ගත්තේ මහත් වූ සතුටිනි. සෑම්ගේ ද සතුටේ නිම්හිම් නැතිව තිබුණි. ඔහුටද කොහොම ස්තූති කළ යුතු දැයි කියා සිතා ගැනීමට හැකි වුණේ නැත. සෑම් ද සමග සතුට බෙදා ගත් මිතුරන් එතැනින් නික්ම ගියේ පොලිස් ස්ථානයේ කොනකට වී සිටි ඇඩම්ස් නෝනාව මුණගැසීමටයි. ඇඩම්ස් නෝනා සිටියේ කඳුළු සලමිනි. ඇයත් සමඟ ඩෙයාර් මහත්මිය කතා බහ කරමින් සිටියා ය. කෙසේ වෙතත් මිතුරන් එතැනට ළං වන විට ඇඩම්ස් නෝනා වෙතින් ඈත් වූ ඩෙයාර් මහත්මිය මිතුරන් පස් දෙනාව ඇමතුවා ය.

"සිද්ධ වුණ දේ නිසා ඇඩම්ස් නෝනා ඉන්නේ ගොඩක් කණගාටුවට පත් වෙලා. ඇඩම්ස් නෝනා තවත් කැමැති නැහැ අපේ ගෙදර වැඩ කරන්න. ඒක ගොඩක් දුක හිතෙන දෙයක් තමයි. ඒ උනාට මේ දේවල් එක්ක ඇඩම්ස් නෝනා තවත් මේ ගමේ ඉන්න එකක් නැහැ. ඇඩම්ස් නෝනයි හෙක්ටරුයි මේ ගමෙන් පිටත් වෙලා යයි. හෙක්ටර්ට වුනත් හිර දඬුවමක් ලැබෙන්නේ නැති එක ගොඩක් ලොකු දෙයක්. මම එහෙම කියන්නෙ වෙන දෙයක් නිසා නෙමෙයි. ඇඩම්ස් නෝනා ගැන හිතලා. මේ උන කිසිම දේකට ඇඩම්ස් නෝනා වරදකාරයෙක් නෙමෙයිනේ."

ඩෙයාර් මහත්මියගේ වචනවල යම්කිසි කණගාටුවක් තැවරී තිබුණි. ඒ ඇසූ ඇලිස්ගේ මුහුණද කණගාටුවෙන් බරවිය. දිගු කාලයක් එම නිවසේ සේවය කළ ඇඩම්ස් නෝනා සියලු දෙනාගේම සිත් දිනාගත් ප්‍රියමනාප අයෙක් විය. ඇඩම්ස් නෝනා මිතුරන් පස් දෙනා දුටු විට නැවත වතාවක් හඬා වැලපී සමාව ඉල්ලන්නට පටන් ගත්තා ය. මිතුරන්ට ඇයව සැනසීමට මහත් වේලාවක් ගත විය. කෙසේ හෝ ඇය සහ ඇලිස් සමුගත්තේ එකිනෙකා වැළඳ ගෙනයි. එය මහත් කණගාටුදායක අවස්ථාවක් විය. කෙසේ හෝ සියලු දෙනාටම පොලිස් ස්ථානයෙන් පිට වන විට මිතුරන්ගේ මුහුණුවල තැවරී තිබුණේ මහත් වූ සතුටකි.

"අපි කොහොම හරි එහෙනම් ලොකුම ලොකු අභිරහසක් තනියම විසඳුවා නේද?" සූසන්ගේ වචනවල සතුට දෝරෙ ගලමින් තිබුණි.

"ඒක තමයි. අපි ගොඩක් පුංචි කාලයක් ඇතුළත මේ අභිරහස සාර්ථක විදිහට විසඳුවා." ජෙසී ද පැවසුවාය.

"මේ අහන්නකෝ... අපේ අම්මා මට කිව්වා අපි හැමෝටම අපේ ගෙදරට යන්න කියලා. අපි කරපු මේ හපන්කම වෙනුවෙන් අපි හැමෝටම රසම රස සංග්‍රහයක් අපේ ගෙදර ලෑස්ති කරලා තියෙනවා. මම හිතන්නේ ඒක ඇඩම්ස් නෝනගෙන් ලැබෙන අන්තිම සංග්‍රහය." ඇලිස්ගේ වදන්වල දුක මෙන්ම සතුට ද තැවරී තිබුණි.

“ඒක නම් ඇත්තටම ගොඩක් හොඳ අදහසක්. එහෙනම් අපි හැමෝම යමුද ඕක් නිවසට, පහුගිය ටිකේ අපිට දැනුනු මහන්සියත් අමතක වෙන්න රසම රස කෑම වේලක් කන්න…”

මිතුරන් පස් දෙනාම බයිසිකල්වල නැගී ඕක් නිවස වෙතට ගමන් කරන්නට වුනේ හිතේ උතුරා ගලන සතුට ද සමගයි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම් ගබඩාව වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වේ. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහ ලේකම්
ව්‍යාපෘති නිර්මාතෘ

ISBN 624211091-1
9786242110912